**ආසියාවේ ආශ්වර්යය තුළින් දේශීය වෛද්‍ය ක්‍රමය ජාත්‍යන්තරය කරා ගෙන යමු.........**



අනාදිමත් කාලයක සිට පරිසරය පදනම් කර ගත් වෛද්‍ය ඥාණයක් හා වෛද්‍ය ක්‍රමයක් අප සතුව පැවති බවට ඓතිහාසික සාක්ෂි එමට ඇත. එම වෛද්‍ය ක්‍රම අතර, ත්‍රිදෝෂ (වා,පිත්,සෙම්) මත පදනම් වූ දේශීය වෛද්‍ය ක්‍රමයට හිමිවන්නේ ඉතා ඉහළ තැනකි. ඉංදු ගංගා මහා තැනිතලාවේ වසර දහස් ගණනක ඉතිහාසයක් පුරා හැදි වැඩී පෝෂණය වූ මෙම වෛද්‍ය ක්‍රමය ආසියාව පුරා විහිදුණු සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රමයකි.

පුලතිසි රාවණා පරපුරෙන් පැවැත එන මෙරට ස්වදේශිකයන් අතර පැවති දියුණු වෛද්‍ය ක්‍රමය බුදු සමයත්, භික්ෂු සමාජයත් පදනම් කරගෙන ව්‍යාප්ත වූ බව ඉතිහාසයෙන් පෙනේ.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ගැමියන් අතර දේශීය වෛද්‍ය ක්‍රමය හා බැඳුණු වෛද්‍ය ඥාණයක් පැවති බවට රොබට් නොක්ස් ආදීන්ගේ වාර්තාවලින් පැහැදිලි වේ.

අප රට බටහිර ජාතීන්ට යටත් වීමෙන් පසු අපේ පාරම්පරික වෙදකම පරිහානියටත්, නොසැලකිල්ලටත් භාජනය විය. අපේ වෙදකම ගොඩේ වෙදකම ලෙසත්, වෛද්‍යවරයා ගොඩේ වෙදා ලෙසත්, හැඳින්වීය. ජාතිකත්වය හා දේශීයත්වය ගර්හා කටයුතු නොවැදගත් දෙයක් බවට පත්විය.

පනස්හයේ ජයග්‍රහණයත් සමඟ ඇති වූ ජාතික ප්‍රබෝධයෙන් හිස එසවූ දේශීය වෛද්‍ය අංශය අද වන විට සුවිශාල ජයග්‍රහණ රැසක් ලබාගෙන තිබේ. වෛද්‍ය ඥාණය විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා වර්ධනය වී ඇත. මෙසේ ව්‍යාප්ත වූ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා වෙනමම කැබිනට් අමාත්‍යාංශයක් ලබාදීම තුළින් එය ජාතික පිළිගැනීමකටද ලක් කර ඇත. ආයුර්වේදය, ලංකායුර්වේදය නොහොත් පාරම්පරික වෙදකම, සිද්ධ, යුනානි, හොමියෝපති ආදි වෛද්‍ය ක්‍රම රාශියකින් සමන්විතය.

ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග ව්‍යාප්තිය, බෝවන රෝග ව්‍යාප්තියද ඉක්මවා ඇත. එම රෝග වැලැක්වීමේ හා ප්‍රතිකාර කිරීමේ ප්‍රශස්ත ක්‍රියාමාර්ගය එහි හේතුකාරක ඉවත් කිරීමයි. එහි ප්‍රවේශය මහජනතාව සුවපත් කරවන කාබනික කෘෂිකර්මය මත පදනම් වූ නිර්විෂ පෝෂණය හා පරිසර හිතකාමී සරල ජීවන පැවැත්මත්, ඊට අදාළ ක්‍රමවේද හා මෘදු මෙවලම් දේශීය හා පාරම්පරික වෛද්‍ය ක්‍රමය සතු අනන්‍ය සම්පතකි. අපේ මාතෘ භූමිය ආසියාවේ ආශ්වර්ය බවට පත් කිරීමේ මහින්ද චින්තනය යථාර්තයක් කළහැකි එක් පැතිකඩක් වන්නේ දේශීය වෛද්‍ය ක්‍රමය ජාත්‍යන්තරයට ඔසවා තැබීමයි.

නිරෝගී ජනතාවක් හා නිරෝගී ශ්‍රම බලකායක් තුළින් දේශයේ සෞඛ්‍ය සංරක්ෂණයේ පෙරගමන්කරුවා ලෙස, අධිරාජ්‍යවාදීන් විසින් නොසලකා හරින ලද, අදද ඇතැම් පිරිස්වල ගැරහීමට ලක්වන දේශීය වෙදකම හා දේශීය වෛද්‍යවරයා තුළින්, සමාජය තුළ පිළිගැනීමක් සහිත ගෞරවනීය වෘත්තියක් හා වෘත්තිකයකු බිහිකිරීමට ප්‍රයත්න දැරීම, දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යය වී ඇත.

**සාලින්ද දිසානායක**
දේශීය වෛද්‍ය අමාත්‍ය

**දේශීය දේ අගය කරමින් අපේකමට පණ පොවන්නට උදාවෙන යුගයක් කරාපියනගමු.........**



නූතන ලෝක ප්‍රවණතාව හමුවේ ස්වභාවික තුරුලතා පදනම් කර ගත් ආයුර්වේද වෙදකමට හිමිවන්නේ සුවිශේෂී තැනකි. දිනෙන් දින වැඩි වන ලෝක ඉල්ලුම සළකා බැලීමේ දී අප සිටිනා තැන හා අප යා යුතු තැන හඳුනා ගැනීම ඉතා වැදගත් කාර්යයක් වී ඇත. මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළින් නව ප්‍රවේශයක් උදා කර දී ඇති මේ මොහොතේ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ළඟා කර ගත යුතු නව ඉලක්කයන් කරා පිය නැගීමට අවස්ථාව දැන් උදා වී තිබේ.

අතීතයේ දස මහා යෝධයන් බිහි කළ අප මුතුන් මිත්තන්ගේ ජීවන රටාව දෙස බලන කළ අපට පෙනී යනුයේ ඔවුන් අනුගමනය කළ නිවැරදි සෞඛ්‍ය සම්පන්න දිවි පැවැත්මයි. එදා පැවැති ජීවන රටාව අනුව ඔවුන්ගේ ආහාර රටාව සකසා ගනුයේ තම ගෙවත්තෙන්මය. වස විස නොමැති භෝග වගාවන්ට ආවේණික වූ ආහාර රටාවකට ඔවුන් හුරු වී තිබිණි. ආයුර්වේද ක්‍රමය ඉන්දියාවෙන් අප ලද වෛද්‍ය ක්‍රමයක් වුවද අපටම ආවේණික වූ පාරම්පරික වෛද්‍ය ක්‍රමයක් අප සතුව පැවැති බව අතීත රාවණා යුගයෙන්ද පෙනී යයි. එය දේශීය වෛද්‍ය ක්‍රමය නම් වේ.

යුරෝපීයයන්ගෙන් ලැබෙන සෑමදේම අන්ධානුකරණයට හුරු වී තිබෙන නූතන අප සමාජය අද සෑම අංශයකින්ම පිරිහුණු රෝගී පරපුරක් දැයට දායාද කරමින්, රටේ අනාගත පරපුරද අඳුරු යුගයකට පත් කරමින් පවතී. මෙවන් යුගයක අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන ප්‍රතිපත්තියට අනුව දේශීය දේ අගය කරමින් අපේකමට පණ පොවන්නට උදාවෙන යුගයක් අපට දැන් උදා කර දී ඇත. මේ හේතුව නිසාදෝ අද අප රට විශාල පරිවර්තනයකට භාජනය වන බවක් පෙනේ. මන්ද, දේශීය වෙදකම අප රටෙහි පමණක් නොව විදේශීය රටවලද ඉතා ඉහළ පිළිගැනීමකට ලක් වී ඇත. ජපානය, චීනය වැනි රටවලද පංචකර්ම මධ්‍යස්ථානයන් බිහිවීම එහි ප්‍රතිඵලයක් බව මින් දැක්විය හැක.

අද ලෝකය දෙස බලන කළ ගෝලීයකරණය හමුවේ සියළුම ක්‍රියාදාමයන් සැණෙකින් මුලු ලොවටම ව්‍යාප්ත කළ හැකි තත්වයකට පත් වී ඇත. ඒ තුළින් පසුගිය වර්ෂය තුළ නොයෙකුත් ආයුර්වේදීය වැඩසටහන් හා ව්‍යාපෘතීන් දියත් කිරීමට අපට හැකි විය. පාරම්පරික දැනුම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය ඉන් සුවිශේෂී තවත් එක් ව්‍යාපෘතියක් වන අතර එමඟින් දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය සහ අභිවෘද්ධිය සඳහා දේශීය වෛද්‍ය ක්‍රමයන්හි පර්යේෂණ කටයුතු සංවර්ධනය කිරීම සිදුකරනු ලබන අතර පාරම්පරිකව පැවත එන දේශීය වෛද්‍ය දැනුම විධිමත් ලෙස ආරක්ෂා කොට ඉදිරි පරපුර වෙත දායාද කිරීම සිදු කෙරේ. එහි එක් අදියරක් ලෙස පාරම්පරික දැනුමට අදාළ බුද්ධිමය දේපළ හිමිකම් පිළිබඳ පැවැත්වූ වැඩමුළුව දැක්විය හැක. තවද, පාරම්පරික වෛද්‍යවරුන්ගෙන් එම දැනුම ලබා ගැනීම සඳහා ඒ පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමට ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් පළාත් මට්ටමින් දියත් කරමින් පවතී.

මුළු ලොවම ගෝලීයකරණයට පාත්‍ර වෙමින් පවතින මෙවන් යුගයක, මිනිසාගේ නීරෝගීකම ඇති කිරීම සුළු පටු නොවන බව සියළු දෙනාම වටහා ගන්නේ නම්, නැවත මේ මුළු ලොවම මානව හිතවාදී තෝතැන්නක් බවට පත් කිරීමට සියළුම ආගම් නායකයින්ගේ යහපත් ඉගැන්වීම් තුළින් මෙන්ම මිනිසාගේ යහපත් දිවිපැවැත්ම තුළින් හැකිවන බව නොඅනුමානය. එවැනි දිවි පැවැත්මක් ඇතිකරලීමට ආයුර්වේදයට හැකිවේවා යන්න මාගේ ප්‍රාර්ථනයයි.

**පණ්ඩු බණ්ඩාරනායක**
දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍ය

**දේශීය වෛද්‍ය ක්‍රමය තුළින් නිරෝගී ජනතාවක් බිහි කරමු............**



දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය වී ඇත්තේ, වසර දහස් ගණනක් අතීතයට විහිදුණු පාරම්පරික දැනුම සම්මිශ්‍රණය වූ හෙළ වෙදකමත්, ආයුර්වේද, සිද්ධ, යුනානි, හෝමියෝපති යනාදී විවිධ වෛද්‍ය ක්‍රම මත පදනම්වය. දේශීය වෛද්‍ය ක්‍රම තුළින් මනා සේවාවක් ලබා දීම මඟින් නීරෝගී ජනතාවක් බිහි කිරීමේ අරමුණ ඇතිව මෑත කාලීනව සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒකාබද්ධව තිබුණු මෙම සේවාව, එයින් වෙන්කර වෙනමම අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත කරන ලදී.

ආයුර්වේදය හා දේශීය වෛද්‍ය ක්‍රම තුළින් සැමට සුවසෙත යන තේමා පාඨය පෙරදැරිකර ගනිමින් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ ආයතන මඟින් රෝග නිවාරණය සඳහා විවිධාකාර වැඩපිළිවෙල් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අතර රෝගී සත්කාරක සේවා සඳහා ඇති රෝහල් තුළින් කාර්යක්ෂම සේවා සැපයීම මෙන්ම ඖෂධ පැළ, ඖෂධ පැළෑටි සංරක්ෂණය හා ව්‍යාප්තිය, පර්යේෂණ වැඩිදියුණු කිරීම, පෝෂණ වැඩසටහන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධනය වැනි වැඩසටහන්ද, ඖෂධ වගාව ප්‍රචලිත කිරීම වැනි සංවර්ධන කාර්යයන්ද පවත්වාගෙන යාම වැදගත්වේ.

දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය සහ විවිධ පර්යේෂණ පුළුල් කරමින් නව ඖෂධ හා ප්‍රතිකාර ක්‍රම හඳුන්වා දීමටද කටයුතු කරනු ලබයි. මෑත කාලයේ සිට බෝ නොවන රෝග පැතිර යාමේ වැඩි ප්‍රවණතාවයක් දක්නට ඇති හෙයින් ඒ රෝග පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් පර්යේෂණ පවත්වනු ලබයි. පිළිකා, හෘද රෝග, වකුගඩු රෝග, අධික රුධිර පීඩනය, ඩෙංගු වැනි රෝග ඒ අතර විශේෂ වේ.

ඒ අනුව, දේශීය වෛද්‍ය ක්‍රම ලොව පෙර නොවූ පිළිගැනීමකට ලක්ව ඇති මෙවන් අවධියක, මහින්ද චින්තන ප්‍රතිපත්තීන් අනුව යමින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය කරා යන ගමනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නීරෝගී ජනතාවක් බිහි කරලීමට දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ සියළුම ආයතන ඉමහත් උත්සාහයක් ගන්නා අතර, එහි ප්‍රගතිය ඉතා ඉක්මණින් ලබා කර ගැනීමට හැකිවනු ඇතැයි මාගේ විශ්වාසයයි.

**පර්ල් වීරසිංහ**

දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්

## දැක්ම

හෙළ වෙදකමින් සැමට සුවසෙත

## මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින් පර්යේෂණ සහ නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සමස්ත ප්‍රජාවට සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය කිරීම තුළින් ඔවුන් ජාතික ආර්ථික හා සහස්‍ර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ප්‍රබල අයුරින් දායක කරවීම.



# පෙළ ගැස්ම


| පටුන | පිටුව |
|---|---|
| 1. හැඳින්වීම | 6 |
| 2. අමාත්‍යාංශ ප්‍රමුඛතා | 7 |
| 3. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන | 9 |
| 4. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල වියදම් සාරාංශය - 2014 | 10 |
| 5. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති/ වැඩසටහන් හා ප්‍රගතිය | 11 |
| 6. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ පිවිසුම | 18 |
| 7. අන්තර් අමාත්‍යාංශ සමඟ සහයෝගීතා වැඩසටහන් | 19 |
| 8. ආයුර්වේද දෙපාර්තමේන්තුව | 22 |
| 9. ආයුර්වේද වෛද්‍ය සභාව | 48 |
| 10. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 51 |
| 11. හෝමියෝපති රෝහල සහ වෛද්‍ය සභාව | 55 |

# 01. හැඳින්වීම

පුලතිසි රාවණ ආදී සෘෂිවරු විසින් ගෙන ආ, බුද්ධදාස ආදී රජවරුන් විසින් රාජ අනුග්‍රාහකත්වය ඇතිව ආරක්ෂා කරමින් පවත්වාගෙන ආ හෙළ වෙදකම සාම්ප්‍රදායික දැනුම මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයකි. එමෙන්ම පාරම්පරිකව පවත්වාගෙන ආ මෙම මහඟු වෛද්‍ය ක්‍රමය සහ බෙහෙත් වට්ටෝරු පසුකාලීනව ලියා තැබීමටද කටයුතු කර ඇති බවට පැරණි ශිලා ලේඛන සහ පුස්කොළ පොත් සාක්ෂි දරයි.

මෙසේ පැවත ආ දේශීය වෙදකමට උතුරු ඉන්දියාවෙන් පැමිණි ආයුර්වේදයත්, දකුණු ඉන්දියාවෙන් ලැබුණු සිද්ධ වෛද්‍ය ක්‍රමයත්, අරාබිකරයෙන් ලැබුණු යුනානි වෛද්‍ය ක්‍රමයත් සම්මිශ්‍රණය වී මේ සියල්ලේ සංකලනයෙන් ශ්‍රී ලාංකේය වෛද්‍ය ශාස්ත්‍රයේ ප්‍රගමනයක් උදා වී ඇති බව පෙනේ.

නිදහසින් පසු 1949 අංක 49 දරණ ව්‍යවස්ථාව මඟින් ස්වදේශීය ආඥා පනත සංශෝධනයෙන් පසුව දේශීය වෛද්‍ය ලියාපදිංචියට අදාළ වගන්ති විධිමත් ලෙස සංශෝධනය කෙරිණ. 1957 දී ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම හා එහි කොමසාරිස් ධූරයට පුද්ගලයෙකු පත් කිරීම සිදු විය. එම පනත නෛතික ව්‍යවස්ථාව බවට පත් වූ පසු ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව පසුව ආයුර්වේද දෙපාර්තමේන්තුව නමින් ස්ථාපිත විය.

1961 අංක 31 දරණ ආයුර්වේද පනත සම්මත කර ගනිමින් ශ්‍රී ලාංකීය දේශීය වෛද්‍ය ක්‍රමයට නව පණක් එක් කරන ලදී. ඒ අනුව 1980 වර්ෂයේදී දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය සඳහා නව අමාත්‍යාංශයක් පිහිට වූ අතර එය 1994 දී කැබිනට් අමාත්‍යාංශයක් බවට පත් විය. එතැන් සිට කැබිනට් ඇමතිවරයෙකුගේ හා නියෝජ්‍ය ඇමතිවරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රමුඛ අපේක්ෂාව වී ඇත්තේ දේශීය වෛද්‍ය ක්‍රම ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම තුළින් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීමයි. එම අපේක්ෂාව මුදුන්පත් කර ගැනීම සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.


- දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීම සඳහා දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම.
- දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම.
- දේශීය ඔසු වගාව පුළුල් ලෙස ක්‍රියාත්මක කරමින් ඖෂධ නිෂ්පාදනය ඉහළ දැමීම.
- සුරක්ෂිත ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තය වැඩිදියුණු කර එය රටේ සංවර්ධනයට දායක කර ගැනීම.
- හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ ප්‍රවර්ධනයක් ඇති කිරීම.

# 02. අමාත්‍යාංශ ප්‍රමුඛතා

| විශේෂ අවධානයට ලක්වූ ප්‍රමුඛතා අංශ | ප්‍රතිඵල නිමැවුම් දර්ශකය |
|---|---|
| 1. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ නීතිමය රාමුව සවිමත් කිරීම | • ආයුර්වේද වෛද්‍ය ක්‍රම භාවිතයේ අක්‍රමිකතා අවම වීම.<br>• වෘත්තීමය වශයෙන් තෘප්තිමත් ආයුර්වේද වෛද්‍යවරුන් බිහිවීම.<br>• ආයුර්වේද ප්‍රතිකාර ආයතන නීතිමය පදනමක් මත ශක්තිමත් කිරීම. |
| 2. ආයුර්වේද පර්යේෂණ ශක්තිමත් කිරීම හා වැඩි දියුණු කිරිම | • ගුණාත්මක භාවයෙන් යුත් නව ආයුර්වේද නිෂ්පාදනවල ප්‍රමාණාත්මක වැඩි වීම.<br>• ආයුර්වේද පර්යේෂකයින්ගේ අයිතීන් තහවුරු වීම.<br>• ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සම්බන්ධ පිළිගැනීම පුළුල් වීම.<br>• ආයුර්වේද පර්යේෂණ හා පර්යේෂකයින් සඳහා වැඩි අවස්ථාවන් සැලසීම.<br>• බෝ නොවන රෝග පාලනය සඳහා දේශීය වෛද්‍ය ක්‍රම හඳුන්වා දීම.<br>• සංරක්ෂණය වූ පාරම්පරික ආයුර්වේද ලේඛන ප්‍රමාණය ඉහළ යාම.<br>• ආයුර්වේදයට සම්බන්ධ බුද්ධිමය දේපළ අයිතීන් සුරක්ෂිත වීම හා විධිමත් වීම. |
| 3. ආයුර්වේදය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම. | • යාවත්කාලීන වූ තොරතුරු පද්ධතියක් නිර්මාණය වීම.<br>• ක්‍රමවත් ජාලගත මෙහෙයුම් පද්ධතියක් නිර්මාණය වීම.<br>• ඊ-ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් නිර්මාණය වීම.<br>• දේශීය වෙදකමේ නිම් වළලු පුළුල් වීම . |

| | |
|---|---|
| 4. ආයුර්වේද සෞඛ්‍ය සංරක්ෂණය යාවත්කාලීන හා වැඩි දියුණු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය | • ගුණාත්මක භාවයෙන් යුත් මානව සම්පත ප්‍රමාණාත්මකව වැඩි වීම.<br>• වෘත්තීමය වශයෙන් තෘප්තිමත් මානව සම්පත වැඩි වීම.<br>• දේශීය වෛද්‍ය ක්‍රම සඳහා ඇති ගෝලීය ඉල්ලුම සැපිරිය හැකි වීම.<br>• පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම හා කුසලතාවය නූතන සමාජ අවශ්‍යතාවය උදෙසා යාවත්කාලීන වීම.<br>• නිපුණතාවයෙන් යුත් දේශීය වෛද්‍යවරු ප්‍රමාණාත්මකව වැඩි වීම.<br>• රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයුර්වේද වෛද්‍ය ක්‍රම භාවිතා කරන්නන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වැඩිදියුණු වී තිබීම. |
| 5. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ ඖෂධීය පැළෑටි වගා කිරීම, වැඩිදියුණු කිරීම සහ ඔසු උයන් ආරම්භ කිරීම | • ඉහළ ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක ඖෂධ ප්‍රමාණය වැඩිවීම.<br>• ආයුර්වේදය තුළින් ආදායම් උත්පාදනය ඉහළ යාම.<br>• ආයුර්වේද ඖෂධ සඳහා ඇති විදේශීය වෙළඳ පොළ අවස්ථා ඉහළ යාම.<br>• භාවිතයට පහසු ඖෂධ නිෂ්පාදනය ඉහළ යාම. |
| 6. ආයුර්වේදය වාණිජකරණය අනුව පවත්වාගෙන යාම. | • පාරම්පරික වෙදකම, ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍ය ක්‍රම ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත වීම.<br>• විශේෂිත වූ ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සැපයීමට හැකිවන පරිදි නවීන පහසුකම් සහිත රෝහල් ඇති වීම.<br>• පවතින ඔසු උයන් හා නව ඔසු උයන් උසස් තත්වයට පත් වීම. |
| 7. හෝමියෝපති වෛද්‍ය ක්‍රම භාවිතය ඉහළ නැංවීම. | • හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ආශ්‍රිත ආයතන විධිමත් ලෙස ස්ථාපිත වීම.<br>• වෘත්තීමය වශයෙන් තෘප්තිමත් හෝමියෝපති මානව සම්පතක් ඇති වීම. |

# 03. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන



# 04.දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල වියදම් සාරාංශය - 2014

| | 2014 වර්ෂයේ ප්‍රතිපාදන (රු.) | 2014 වර්ෂයේ වියදම (රු.) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| **දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයතන** | | | |
| **පුනරාවර්තන** | **248 960 000.00** | **219 877 774.85** | **88.32** |
| සාමාන්‍ය පරිපාලනය/ වෙනත් වැඩසටහන් | 219 460 000.00 | 200 039 225.03 | 91.15 |
| ආයතන සේවා<br>▪ හෝමියෝපති වෛද්‍ය සභාව/<br>රෝහල | <br>9 000 000.00<br>16 500 000.00 | <br>6 228 079. 92<br>11 544 972. 34 | <br>69.20<br>69.97 |
| විශේෂ වැඩසටහන්<br>• පෝෂණ වැඩසටහන | <br><br>4 000 000.00 | <br><br>2 065 497. 56 | <br><br>51.64 |
| **ප්‍රාග්ධන** | **272 040 000.00** | **228 707 681.90** | **84.07** |
| සාමාන්‍ය පරිපාලනය | 14 940 000.00 | 10 578 130.06 | 70.80 |
| විශේෂ වැඩසටහන්<br>• ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන<br>• ඖෂධ සංස්ථාවේ ඉදිකිරීම<br>• සංරක්ෂණ සභා<br>• තරුණ ඔසුගොවි ගම්මාන වැඩසටහන<br>• හෝමියෝපති වෛද්‍ය සභාව<br>• හෝමියෝපති ක්‍රම සංවර්ධනය<br>• පෝෂණ මන්දිර | <br>100 000 000.00<br>100 000 000.00<br>6 100 000.00<br><br>1 000 000.00<br><br>2 000 000.00<br>45 000 000.00<br>3 000 000.00 | <br>89 394 841. 61<br>100 000 000. 00<br>4 810 346. 94<br><br>156 847. 50<br><br>478 874. 00<br>20 656 761.76<br>2 631 880. 03 | <br>89.39<br><br>100.00<br>78.86<br>15.68<br><br>23.94<br>45.90<br>87.73 |
| **මුළු එකතුව** | **521 000 000.00** | **448 585 456.75** | **86.10** |

### ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යයන් අනුව වියදම් සාරාංශය - 2014

| | 2014 වර්ෂයේ ප්‍රතිපාදන (රු.) | 2014 වර්ෂයේ වියදම (රු.) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| **පුනරාවර්තන** | **848 820 000.00** | **821 141 069.00** | **96.74** |
| 1. සාමාන්‍ය පරිපාලනය | 94 200 000.00 | 89 271 333.00 | 94.77 |
| 2. රෝහල් සේවා | 520 572 000.00 | 507 514 785.00 | 97.49 |
| 3. පර්යේෂණ | 139 198 000.00 | 137 100 748.00 | 98.49 |
| 4. අධ්‍යාපන හා පරිපාලන | 39 050 000.00 | 34 854 285.00 | 89.25 |
| 5. ඖෂධ වගාව, සංරක්ෂණය හා ව්‍යාපතිය | 55 800 000.00 | 52 399 918.00 | 93.9 |
| **ප්‍රාග්ධන** | **498 686 000.00** | **357 982 372.00** | **71.79** |
| 1. සාමාන්‍ය පරිපාලනය | 10 400 000.00 | 9 850 712.00 | 94.7 |
| 2. රෝග නිවාරණ සේවා | 167 182 267.00 | 55 314 249.00 | 33.08 |
| 3. පර්යේෂණ | 288 303 733.00 | 269 262 147.00 | 93.39 |
| 4. අධ්‍යාපන හා පරිපාලන | 8 150 000.00 | 6 312 280.00 | 77.45 |
| 5. ඖෂධ වගාව, සංරක්ෂණය හා ව්‍යාපෘතිය | 24 650 0000.00 | 17 242 984.00 | 69.95 |
| **මුළු එකතුව** | **1 347 506 000.00** | **1 179 123 441.00** | **87.50** |

# 05. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති / වැඩසටහන් හා ප්‍රගතිය

## 5.1 අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ රෝග නිවාරණය සඳහා ක්‍රියාත්මක වන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 පුරා ක්‍රියාත්මක වේ. වර්ෂ 2001දී නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කළ මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ජනතාව දැනුවත් කිරීම මඟින් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීම හා ඒ තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමයි. මෙම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අතර, පහත වැඩසටහන් ප්‍රමුඛතාවයෙහිලා සැලකේ.

### වකුගඩු රෝග නිවාරණ වැඩසටහන







# පාසල් වැඩසටහන්











# ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය - අනුරාධපුරය 2014 වර්ෂයේ ප්‍රගති සාරාංශය

| අනු අංකය | වැඩසටහන | | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| 1 | ආරක්ෂිත ජලය පරිහරණය කරමු | 1.ජල පෝෂක සුරකීමේ ව්‍යාපෘතිය | 22 | 934 |
| | | 2. ජල සාම්පල විශ්ලේෂණ වැඩසටහන් සංඛ්‍යාව | 9 | |
| 2 | දේශීය ආහාර ප්‍රචලිත කිරීම "හෙළ අහරින් සුවය රකිමු" | 1.ප්‍රායෝගික වැඩසටහන් සංඛ්‍යාව | 1395 | 34207 |
| | | 2.දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 1800 | |
| 3 | ළමා සෞඛ්‍ය සංරක්ෂණය | 1.ළමා ස්වස්ථතා ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | 1474 | 23206 |
| | | 2.ළමා සායන සංඛ්‍යාව | 704 | |
| | | 3. දැනුවත් කිරීමේ වැඩ සටහන් සංඛ්‍යාව | 1194 | |
| 4 | බෝ නොවන රෝග පාලන | 1.ජංගම වෛද්‍ය සායන සංඛ්‍යාව | 626 | 24854 |
| | | 2.සුරකිමු වකුගඩු දුරලමු දියවැඩියාව | 410 | 25402 |
| | | 3.වෘත්තීය සෞඛ්‍යයි ආයුර්වේදයයි වැඩසටහන් සංඛ්‍යාව | 272 | 6257 |
| | | 4.කාබනික ගෙවතු වගා වැඩසටහන් සංඛ්‍යාව | 1224 | 9313 |
| | | 5.සාම්ප්‍රදායික වී වගාවට නැඹුරු කල ගොවීන් සංඛ්‍යාව | * | 817 |
| | | 6.ගෘහ ඒකක දැනුවත් කිරීම- ගෘහ ඒකක සංඛ්‍යාව | * | 39409 |
| 5 | බෝ නොවන රෝග පාලනය | 1.දැනුවත් කිරීම/සම්මන්ත්‍රණ සංඛ්‍යාව | 935 | 20924 |
| 6 | මාතෘ සංරක්ෂණය | 1.මාතෘ සායන සංඛ්‍යාව | 64 | 1077 |
| 7 | පාසල් වැඩසටහන් | 1.සරෝදනී වැඩසටහන් සංඛ්‍යාව | 21 | 1600 |
| | | 2. 5 වසර ශිෂ්‍යත්ව උපකාරක වැඩසටහන් සංඛ්‍යාව | 138 | 5424 |
| | | 3. ආයුර්වේදීය මුඛ සෞඛ්‍ය වැඩසටහන් සංඛ්‍යාව | 260 | 7051 |
| | | 4. යෝග හා විහරණ වැඩසටහන් සංඛ්‍යාව | 58 | 2366 |
| 8 | වැඩිහිටි සත්කාරක සේවාව | 1.ගෘහස්ථ ඖෂධ මංජුසා වැඩසටහන් සංඛ්‍යාව | 123 | 630 |
| | | 2. සායන සංඛ්‍යාව | 162 | 3832 |
| 9 | ප්‍රජා සත්කාරක සේවා | 1.පොලිස්/ රණවිරු සත්කාරක සේවා වැඩසටහන් සංඛ්‍යාව | 13 | 863 |
| | | 2. අභිමංසල ආබාධිත රණවිරු සත්කාරක සේවා වැඩසටහන් සංඛ්‍යාව | 4 | 58 |
| | | 3. ප්‍රාදේශීය ජංගම සේවා වැඩසටහන් සංඛ්‍යාව | 137 | 5918 |
| | | 4. හදිසි ආපදා කළමනාකරණ වැඩසටහන් සංඛ්‍යාව | 21 | 601 |
| | | 5. වෙනත් වැඩසටහන් | 363 | 23479 |
| 10 | රජ රට වෛද්‍ය පීඨය පර්යේෂණ වැඩසටහන | 1.වැඩිහිටි සත්කාරක සේවා වැඩසටහන් | 322 | 1200 |
| | | 2.මාතෘ සංරක්ෂණ වැඩසටහන් | 46 | 258 |
| | | 3.ළමා පෝෂණ වැඩසටහන් (1-5) | 19 | 1-5 වසර සිසුන් 1650 |
| | | 4.පාසල් වැඩසටහන් | 8 | |
| | | 5.බෝ නොවන රෝග පාලනය වැඩසටහන් | 205 | |
| 11 | ඖෂධ පැළෑටි සංරක්ෂණය හා තිරසාර භාවිතය | **ඔසු උයන්**<br>1. රාජ්‍ය ආයතන හා පාසල් 258ක් සඳහා පැළ 3343ක් ලබා දී ඇත.<br>2. ආදර්ශ පැළ තවාන් 71ක් ක්‍රියාත්මක කර ඇත | | |

***ගෙන් ගෙට ගොස් පවත්වනු ලබන වැඩසටහනකි.**

## 5.2 ආයුර්වේද ජීවන දර්ශනය සහ පෝෂණය - දේශීය ආහාර රටාව තුළින් බෝ නොවන රෝග පාලනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩපිළිවෙල ශක්තිමත් කරමින් දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු සාලින්ද දිසානායක මැතිතුමාගේ මහ පෙන්වීම අනුව දියත් කර ඇති මෙම වැඩසටහන, රාජ්‍ය, සංස්ථා හා පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා ක්‍රියාත්මක වන දේශීය ආහාර ප්‍රවර්ධන හා ආයුර්වේද ජීවන දර්ශනය හඳුන්වාදීමේ වැඩසටහනකි. වර්තමානයේ සීග්‍රයෙන් ව්‍යාප්ත වන බෝ නොවන රෝග පාලනය මෙහි ප්‍රධාන පරමාර්ථය වන අතර, මෙය ඉතා ජනප්‍රිය වැඩසටහනක් බවට පත්ව ඇත. එසේම, හෘද රෝග, අධි රුධිර පීඩනය, වකුගඩු රෝග, පිළිකා සහ දියවැඩියාව වැනි බෝ නොවන රෝග සඳහා වැය කරන විශාල මුදල් සම්භාරයක් ඉතිරි කරගැනීමද මෙමගින් අරමුණු කෙරේ. 2014 ජනවාරි සිට දෙසැම්බර් 31 වන විට කුලියාපිටිය, කුරුණෑගල, වැල්ලවාය, බිංගිරිය, හල්දුම්මුල්ල, මහනුවර ගඟවට කෝරලය, මිහින්තලය, වීරකැටිය, දමන, බුලත්කොහුපිටිය, ගලිගමුව, කහටගස්දිගිලිය, අනුරාධපුර මධ්‍යම නුවරගම් පළාත, කැබිතිගොල්ලෑව, කැකිරාව, අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත, නාච්චදූව, පන්නල, යටියන්තොට, ගිරිබාව, රඹුක්කන, තිරප්පනේ, හොරොව්පතාන, පදවිය, ඉපලෝගම, විලච්චිය. පස්ගොඩ, කොළඹ, හංවැල්ල, අධිකරණ අමාත්‍යාංශය කොළඹ යන ප්‍රදේශවල වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ඖෂධ උද්‍යාන සහ නගර ශාලා කේන්ද්‍ර කර ගනිමින් මෙවන් වැඩසටහන් තිස් එකක් (31) පමණ රාජ්‍ය, සංස්ථා හා පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා පවත්වා ඇත. සාමාන්‍යයෙන් එක් වැඩසටහනක් සඳහා 200කට වැඩි පිරිසක් සහභාගී වී ඇති අතර 2014. 04. 01 දින වැල්ලවාය මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද වැඩසටහන සඳහා දහසක (1000) පිරිසක්ද, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වනු ලැබූ වැඩසටහන සඳහා හයසියයක (600) පිරිසක්ද ආදී වශයෙන් සහභාගී වී ඇත. දේශීය ආහාර භාවිතය මගින් වකුගඩු රෝග නිවාරණය සඳහා කටයුතු කිරීම සම්බන්ධව දැනුවත් කිරීමද මෙහිදී සිදු වේ.





## 5.3 පෝෂණ මන්දිර වැඩසටහන

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය නඟා සිටුවා දේශීය ආහාර, ඖසුපැන් සහ කොළකැඳ ජනතාව අතර ජනප්‍රිය කරවමින් ආයුර්වේද චර්යාවන්ට ජනතාව හුරු කරවමින් පෝෂණ තත්ත්වයන් වැඩි දියුණු කර  නිරෝගිමත් පුරවැසියන් පිරිසක් බිහිකිරීමේ අරමුණ පෙරදැරි කොටගෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පෝෂණ මන්දිර ඉදි කිරීම හා කොළ කැඳ කරත්ත බෙදා දීම මේ මඟින් සිදු කෙරේ.  මෙම අරමුණු පෙරදැරි කරගනිමින් දිවයිනේ විවිධ ප්‍රදේශවල පෝෂණ මන්දිර රාශියක් ඉදිකර ඇති අතර, 2014 වසරේ මේ සඳහා ලැබුණු ප්‍රතිපාදන මත  බොරැල්ල  ආයුර්වේද රෝහල් සංකීර්ණයේ නවතම පෝෂණ මන්දිරයේ ඉදිකිරිම් කටයුතු මේ වන විට අවසන්කර ඇත. එමෙන්ම කොටවෙහෙර  ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පෝෂණ මන්දිරයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහාත්, ගනේවත්ත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තුළ පෝෂණ මන්දිරය අළුත්වැඩියා කිරීම සඳහාත් ප්‍රතිපාදන නිදහස් කර යවා ඇත.



**බොරැල්ල  ආයුර්වේද රෝහල් සංකීර්ණයේ ඉදිකර ඇති නවතම පෝෂණ මන්දිරය**

## 5.4 සංරක්ෂණ සභා

පාරම්පරික වෛද්‍යවරුන් දිරිමත් කිරීම සඳහා සහ ඔවුන්ගේ ජීවන තත්වය නඟාසිටුවීමේ අරමුණ ඇතිව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට 1 බැගින් සංරක්ෂණ සභා පිහිටුවා ඇත. 2013 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සංරක්ෂණ සභා 14කට ඖෂධ කුඩු කිරීමේ යන්ත්‍ර හා තෙල් සිඳීමේ යන්ත්‍ර 07 බැගින් ප්‍රදානය කර ඇති අතර 2014 වර්ෂයේ යන්ත්‍ර 58ක් සංරක්ෂණ සභා සඳහා බෙදා දී ඇත. දිවයින පුරා දැනට ක්‍රියාකාරී සංරක්ෂණ සභා වෙනුවෙන් (ඉල්ලීම් කර ඇති සහ තෝරාගත් පරිදි) ඖෂධ නිෂ්පාදන උපකරණ ප්‍රදානය කරන ලදී. තව දුරටත් ඉදිරියේදී ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන තෙල් සිඳීමේ හා ඖෂධ ඇඹරීමේ යන්ත්‍ර ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් වරුන් මඟින් දැනුවත් කර ඇත. තවද සංරක්ෂණ සභා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රජයේ ඉඩම්වල ඔසු උයන් (නව ව්‍යාපෘති) ආරම්භ කිරීමට දැනුවත් කර ඇත.



## 5.5 තරුණ ඔසු ගොවි වැඩසටහන

ග්‍රාමීය මට්ටමින් තරුණ තරුණියන් ඔසු වගාව සඳහා යොමු කිරීම තුළින් ඔවුන්ට අතිරේක ආදායම් මාර්ගයක් සකසාදීමේ පරමාර්ථයෙන් ක්‍රියාත්මක වන වැඩසටහනකි. දේශීය වශයෙන් පවතින අමුද්‍රව්‍ය හිඟය , ඉල්ලුමට සරිලන සැපයුමක් නොතිබීම, විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අමුද්‍රව්‍ය ආනයනයේදී වැයවීම යන කරුණු සැලකිල්ලට ගනිමින් ඊට විසඳුමක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. තවද ඉන්දියාව, පාකිස්ථානය වැනි රටවලින් අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී එම රටවල් ආනයනයන් සීමා කිරීම වැනි කරුණුද මේ සඳහා හේතු විය. 2014 වර්ෂයේදී ගිරාදුරු කෝට්ටේ ඖෂධ උද්‍යානයේ වෙන් කර ගත් බිම් ප්‍රදේශයක ඔසු ගොවි ගම්මාන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

## 5.6 හිස තෙල් ගෑමේ රාජ්‍ය උත්සවය

හිස තෙල් ගෑමේ රාජ්‍ය උත්සවය 2014 අප්‍රේල් 16 දින පූර්වභාග 11.41 ට යෙදුණු සුබ නැකතින්, අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගම්පහ කොස්සින්න රජමහා විහාර පරිශ්‍රයේදී පවත්වන ලදී. සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයට සමගාමීව පවත්වනු ලබන මෙම උත්සවය සෑම වර්ෂයක් පාසාම දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබයි. මෙම රාජ්‍ය මහෝත්සවය ජාතික රූපවාහිනී නාලිකාව ඇතුළු විද්‍යුත් මාධ්‍ය මඟින් දිවයින පුරා සජීවීව විකාශය කරන ලදී. මෙයට සමගාමීව දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ සියළුම විහාරස්ථාන වලට හා වෛද්‍යවරුන්ට ආයුර්වේද ලිත හා හිස තෙල් ගෑමේ නානු පැකට් බෙදා හැරීමක්ද සිදු විය. තවද අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ආයුර්වේද සමීක්ෂාව සඟරාව 2014-2015 එළිදැක්වීමද එදින සිදු විය.



**ගම්පහ කොස්සින්න රජමහා විහාරයේදී පැවති හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවය**

# 06. අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ පිවිසුම

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් නිකුත් කරන ලද ප්‍රතිපත්ති අංක 10101 හා 10102 යටතේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයීය තොරතුරු තාක්ෂණ අංශය ක්‍රියාත්මක වේ. ආයුර්වේදය පිළිබඳ දැනුම, අවබෝධය හා ආයුර්වේදීය ජීවන රටාව සම්බන්ධ යහපත් සෞඛ්‍ය පුරුදු ගොඩනැගීමේ අරමුණින් ඖෂධ පැළෑටි, ආයුර්වේදීය ආහාර රටාව හා එදිනෙදා ජීවිතයට අදාළ අත් බෙහෙත් ආදී තොරතුරු ඇතුළත් ඊ මේල් පණිවුඩ සේවාවක් ආකර්ෂණීය ආකාරයෙන් පවත්වාගෙන යාම අමාත්‍යාංශයීය තොරතුරු තාක්ෂණ අංශය මඟින් සිදුකරන සුවිශේෂී කාර්යයකි. තවද මේ යටතේ පහත කාර්යයන්ද කරගෙන යනු ලබයි.

- අමාත්‍යාංශ වෙබ් අඩවිය පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම.
- මාත්‍යාංශ පරිගණක ජාල පද්ධතිය නඩත්තුව හා අලුත්වැඩියාව සඳහා සහාය වීම.
- පරිගණක නඩත්තුව, අලුත්වැඩියාව හා සේවා කටයුතු සඳහා සහාය වීම.
- අමාත්‍යාංශයේ ග්‍රැෆික් නිර්මාණ කටයුතු (පොත්, වාර්තා, බැනර්, සංයුක්ත තැටි) සිදු කිරීම.




www.indigenousmedimini.gov.lk

# 07. අන්තර් අමාත්‍යාංශ සමඟ සහයෝගීතා වැඩසටහන්

- දැයට කිරුල ජාතික සංවර්ධන වැඩසටහන සඳහා දායකත්වය
- පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ ඔසු වගාව
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ දිවි නැගුම
- සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සමඟ ආදිවාසීන්ගේ වෙදකම සංරක්ෂණය කිරීම

## 7.1 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන සඳහා දායකත්වය



දැයට කිරුළ ප්‍රදර්ශන කුටි

2014 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන වයඹ පළාතේ කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කද, සබරගමු පලාතේ කෑගල්ල දිස්ත්‍රික්කයද මූලික කර ගනිමින් ක්‍රියාත්මක කළ අතර ඒ හා සමගාමීව දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, එම දිස්ත්‍රික්ක වල ග්‍රාමීය ජනතාවගේ පොදු හා පෞද්ගලික අවශ්‍යතා හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම අරමුණු කර ගනිමින් ග්‍රාමීය ජනතා හමු සහ ජංගම සේවා වැඩපිළිවෙලවල් සියළු ග්‍රාමසේවා වසම් ආවරණය කරමින් පවත්වනු ලැබීය. එම ජංගම සේවා සායන වලදී හඳුනාගත් රෝගීන් සඳහා ආයුර්වේද සායන පැවැත්වූ අතර ආයුර්වේද ජීවන දර්ශනය පිලිබඳ දැනුවත් කිරිම සහ ඖෂධ වගාව ප්‍රචලිත කිරිම පිලිබඳ වැඩසටහන් ද එම ප්‍රදේශවාසී ජනතාව උදෙසා ක්‍රියාත්මක කරන ලදී. තවද දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව දේශීය ඖෂධීය ආහාර පරිභෝජනයේ වැදගත්කම හුවා දක්වමින්, ප්‍රජාව ඒ සඳහා හුරුකරවිම අරමුණු කරගනිමින්, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් ස්වයං රැකියා ලාභීන් පස් දෙනෙකු සඳහා ඔසු පැන් කරත්ත බෙදාදීමද සිදුවිය. වයඹ විශ්ව විද්‍යාලය, කුලියාපිටිය කාර්මික විද්‍යාලය හා මධ්‍ය මහා විද්‍යාලය කේන්ද්‍ර කර ගනිමින්, අමාත්‍යාංශය යටතේ පහත කරුණු මත පදනම්ව, දැයට කිරුළ ප්‍රදර්ශන කුටි සහ ඖෂධ උද්‍යානයක් ද සකස් කරන ලදී.

01. අමාත්‍යාංශ කාර්ය භාරය පිලිබඳ දැනුවත් කිරීම.

02. පෝෂණීය ආහාර භාවිතය.

03. යහපත් ජීවන රටාවක් අනුව කටයුතු කිරිමෙන් ලෙඩ රෝග වලක්වා ගැනීම පිලිබඳ දැනුවත් කිරීම.

04. සායනික ප්‍රතිකාර මඟින් ලෙඩ රෝග සුවපත් කිරිම සඳහා කරනු ලබන මෙහෙවර පිලිබඳ දැනුවත් කිරීමේ කුටිය

05. ඖෂධ අලෙවිසැල හා ඖෂධ නිෂ්පාදනය සම්බන්ධ ප්‍රදර්ශන කුටිය

06. ඉපැරණි වෙදගෙදරක අඩංගු උපකරණ හා එහි වැදගත්කම

07. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිලිබඳ දැනුවත් කිරීම

08. පාරම්පරික වෛද්‍ය සායනය

## 7.2 පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ ඔසු වගාව

බන්ධනාගාර හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ එක්ව කරනු ලබන මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වන්නේ බන්ධනාගාර රැඳවියන් හා පුනරුත්ථාපන අභ්‍යාසලාභීන්ගේ යහපත් සෞඛ්‍ය තත්ත්වය පවත්වාගෙන යාම හා ඔවුන්ට ආදායම් මාර්ගයක් උපයාදීමයි. මෙම වැඩසටහන සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ ගණනාවකගේ දායකත්වය ලැබෙන අතර 2014 වර්ෂය සඳහා වීරවිල පිහිටි බන්ධනාගාර එළිමහන් වැඩ කඳවුර සඳහා මාසිකව ආයුර්වේද වෛද්‍ය සායන පැවැත්වීමට කටයතු කර ඇත. එමෙන්ම තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි බන්ධනාගාර නේවාසිකයන්ට සර්ප වෙදකම, කැඩුම් බිඳුම් වෙදකම, හා ඇස් වෙදකම පිළිබඳව පුහුණු කිරීම හා දේශීය වෙදකම සමාජගත කිරීම සඳහා ඔවුන්ව දැනුවත් කිරීමේ අරමුණින් ආයුර්වේද සංරක්ෂණ සභාවල සහයෝගය ලබාදීමට සම්බන්ධීකරණ කටයුතු කර ඇත.

## 7.3 දොරින් දොරට ගමින් ගමට (දිවි නැඟුම 6 වන අදියර - 2014)

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මත දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ඉහත වැඩසටහන යටතේ,

01. ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීමට ඖෂධීය ශාක වගාව

02. ගෙවතු සංවර්ධනයට ඔසු පැළ ලබාදීම

03. ස්වයං රැකියා සඳහා ඖෂධීය ශාක ලබාදීම සිදු කර ඇත.

ඒ පිළිබඳව තෝරාගත් දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම සිදු කරන අතර දිවිනැඟුම 6 වන අදියර යටතේ රාජ්‍ය ආයතන පරිශ්‍රයන්හි බෝග සිටුවීමට අවශ්‍ය බීජ කට්ටල/පැළ ලබාදෙන ලදී. තවද ස්වයං රැකියා බිහි කිරීමේ පරමාර්ථය ඇතිව ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින්,

- කොළ කැඳ නිෂ්පාදනය දිරි ගැන්වීම
- පැළ තවාන් ඇති කිරීම
- ඖෂධීය ආහාර පාන නිෂ්පාදනය දිරි ගැන්වීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩමුළු හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදී.



| දිස්ත්‍රික්කය | බෙදා දෙන ලද ඖෂධීය පැළ ප්‍රමාණය |
|---|---|
| හම්බන්තොට | 10,800 |
| බදුල්ල | 5,208 |
| නුවරඑළිය | 5,892 |
| අනුරාධපුරය | 15,600 |
| ගාල්ල | 16,944 |
| ගම්පහ | 11,292 |
| කුරුණෑගල | 24,720 |
| මහනුවර | 17,747 |
| **එකතුව** | **108,203** |



# 08. ආයුර්වේද දෙපාර්තමේන්තුව



### *දෙපාර්තමේන්තුවේ දැක්ම*

ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රම තුළින් සැමට සුවසෙත

### *දෙපාර්තමේන්තුවේ මෙහෙවර*

ආයුර්වේද හා පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා අනන්‍යතාව සුරක්ෂිත කිරීම තුළින් සැමට සුවසෙත ළඟා කර දීම සඳහා ජාතික මට්ටමින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම

ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් අනුව එහි ආයතන හා පාලන, සංවර්ධන, ශිල්පීය, විභාග සහ ගිණුම් යන අංශ යටතේ පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

## ප්‍රධාන කාර්යයන්

- පර්යේෂණ හා ශික්ෂණ කටයුතු සඳහා රෝහල් හා අනෙකුත් අංශ පිහිටුවීම හා නඩත්තු කිරීම
- සම්මන්ත්‍රණ, අභ්‍යාස පන්ති, හා අධ්‍යයන පාඨමාලා පැවැත්වීම
- සායනික වෛද්‍ය සේවා හා සාහිත්‍ය පර්යේෂණ පැවැත්වීම
- ඖෂධීය ශාක වගා කිරීම, සංරක්ෂණය හා ප්‍රචලිත කිරීම
- දිවයිනේ සියලු ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් අධීක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම
- ආයුර්වේද රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදන ආයතන හා පෞද්ගලික ආයුර්වේද අධ්‍යාපනයට අදාළ කටයුතු සඳහා නීති හා රෙගුලාසි සකස් කිරීම

# ආයුර්වේද දෙපාර්තමේන්තුව

## ප්‍රධාන කාර්යාලයය

1. ආයතන සහ පාලන අංශය
2. ශිල්පීය අංශය
3. ගිණුම් අංශය
4. සංවර්ධන අංශය
5. විභාග අංශය

## ආයුර්වේද ශික්ෂණ රෝහල්

1. ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල
2. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල -යක්කල
3. සිද්ධ ශික්ෂණ රෝහල - කයිතඩි
4. සිද්ධ ශික්ෂණ රෝහල - ත්‍රිකුණාමලය
5. යුනානි ආයුර්වේද රෝහල - මන්වන්තුඩුව

## නාවින්න ආයුර්වේද පර්යේෂණායතන

## ආයුර්වේද පර්යේෂණ රෝහල්

1. හම්බන්තොට ආයුර්වේද පර්යේෂණ රෝහල
2. පාරම්පරික පර්යේෂණ රෝහල, මිහින්තලය
3. ආයුර්වේද රෝහල- අම්පාර

## දේශිය වෛද්‍ය ක්‍රම පිළිබද ජාතික ආයතනය

## ඔසු උයන්

1. ගිරාදුරුකෝට්ටේ
2. පල්ලේකැලේ
3. හල්දුම්මුල්ල
4. පින්නදූව
5. පට්ටිපොළ
6. කන්නෙලිය
7. නාවින්න

**1.ආයතන හා පාලන අංශය**

2014 වර්ෂය සඳහා වෛද්‍ය නිලධාරීන් 207ක්, භෛෂජ්ජක 16ක් හා කණිෂ්ඨ සේවකයන් 121ක් බඳවාගෙන ඇත. එමෙන්ම බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණායතනයේ යෝජිත කාර්ය මණ්ඩල සඳහා අනුමැතිය ලැබී ඇති අතර බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම සඳහා අනුමැතියට යොමු කර ඇත. ආයුර්වේද දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතනවල අනුමත කාර්ය මණ්ඩල තුළ යෝජිත සංශෝධන අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

**විදේශ පුහුණුවීම්**

- චීනයේ පැවැත්වූ පාරම්පරික චීන වෛද්‍ය කර්ම පිළිබඳ පුහුණුව සඳහා 2014.04.16 දින සිට 2014.06.13 දින දක්වා වෛද්‍යවරුන් තිදෙනෙකු සහභාගී වී ඇත.
- දෙපාර්තමේන්තු නිලධාරීන් තිදෙනෙකු 2014.05.28 දින සිට 2014.06.01 දින දක්වා තායිලන්තයේ පැවැත්වූ අභ්‍යන්තර උපායමාර්ගික සැළසුම් කළමනාකරණ පුහුණුව සඳහා සහභාගී වී ඇත.
- දෙපාර්තමේන්තු නිලධාරීන් දෙදෙනෙකු තායිලන්තයේ 2014.10.25 දින සිට 2014.10.30 දක්වා පැවැත්වූ උසස් අධ්‍යාපන කළමනාකරණ පුහුණුව සඳහා සහභාගී විය.
- ඉන්දියාවේ අවුරුදු 3ක කාලයක් පැවැත්වෙන එම්.ඩී.(ආයු.) පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා වෛද්‍යවරුන් 2දෙනෙකු නිදහස් කර ඇත.
- දකුණු කොරියාවේ 2014.12.07 දින සිට 2014.12.14 දින දක්වා පැවැත්වූ පාරම්පරික කොරියානු වෛද්‍ය කර්මය පිළිබඳ පුහුණුව සඳහා වෛද්‍යවරයකු සහභාගී වී ඇත.

**2. සංවර්ධන අංශය**

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිති කොට පවත්වන ලද හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2014-04-16 දින කොස්සින්න රජමහා විහාරයේදී පවත්වන ලදී. මේ සඳහා වැය කර ඇති මුදල රු.මි. 2.6 කි.

**ජංගම සායන**

පාරම්පරික වෛද්‍ය කර්මයන් රැක ගනිමින් දේශීය වෛද්‍ය කර්මයන්ට ජනතාව හුරු කිරීමේ අරමුණින් ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් ජංගම සායන පවත්වනු ලබයි. රාජ්‍ය ආයතන, විහාරස්ථාන, පෞද්ගලික සංගම් සහ පාසල්වල ඉල්ලීම් අනුව සායන පැවැත්වීම සඳහා රුපියල් මිලියන 1.4ක මුදලක් වෙන් කර අදාළ රෝහල් වෙත ආයුර්වේද කොමසාරිස්ගේ අනුමැතිය අනුව පවරන ලදී.

| | | |
|---|---|---|
| ආයුර්වේද රෝහල් වෙත පැවරීම | - | ජංගම සායන 94 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවලට පැවරීම | - | ජංගම සායන 8 |

**දේශීය පාන වර්ග ජනප්‍රිය කිරීමේ වැඩසටහන**

ජනතාව දේශීය පාන වර්ග සඳහා යොමු කිරීමේ අරමුණින් සහ රාජ්‍ය උත්සව සහ වෙනත් සංවිධානවල උත්සව සඳහා කොල කැඳ, ඔසු පැන් ආයුර්වේද කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව නොමිලේ ලබා දෙනු ලැබේ. 2014 වර්ෂයේදී පැවැත්වූ වැඩසටහන් 33ක් සඳහා සහභාගී වූ 50,000ක් පමණ ජනතාව සඳහා කොල කැඳ නොමිලේ ලබා දී ඇත.

**ආයුර්වේද ප්‍රදර්ශන**

ආයුර්වේදය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් දේශීය පැළ සහ දේශීය ප්‍රතිකාර සේවා පිළිඹිබු වන ආකාරයෙන් ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීම මෙමඟින් සිදු කෙරේ.

| දිනය | ස්ථානය |
|---|---|
| 2014.01.10 , 12 | සීතාවක අභිමන අධ්‍යාපනික පුරා විද්‍යා හා තාක්ෂණික ප්‍රදර්ශනය - 2014 කොස්ගම සුමේධ විද්‍යාලය |
| 2014.02.21 - 2014.03.01 | දැයට කිරුළ ප්‍රදර්ශනය - කුලියාපිටිය කාර්මික විද්‍යාලය |
| 2014.06.12.13,14 | පාරමිතා පොසොන් උද්‍යානය - කැළණිය වේවැල්දූව කොට්ඨාශය |
| 2014.07.03,04 | පානදුර ලීඩ්ස් ජාත්‍යන්තර පාසල් 15 සංවත්සරය නිමිත්තෙන් ඖෂධ පැළ ප්‍රදර්ශනය |
| 2014.07.24,25,26 | Ayur_Ex Kandy -2014 අන්තර් ජාතික ආයුර්වේද අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනය - කැන්ඩි සිටි සෙන්ටර් |
| 2014.08.04 | ශිෂ්‍යත්ව හදාරන දරුවන් සඳහා ඖෂධ පැලෑටි ප්‍රදර්ශනය - ගම්පහ ගෝතමී විද්‍යාලය |
| 2014.09.06 -2014.09.11 | ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනී - 2014 මහනුවර ගැටඹේ මහානාම විද්‍යාලය |
| 2014.09.09 -2014.09.14 | ජාතික ගොවි සතිය හා කෘෂිකාර්මික ප්‍රදර්ශනය -2014 මාතර තෙලිජ්ජවිල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය |
| 2014.10.18,19 | දීඝායු ආයුර්වේද සෞඛ්‍ය කඳවුර හා අධ්‍යාපනික ප්‍රදර්ශනය - මොරටුව වේල්ස් කුමර විද්‍යාලය |
| 2014.12.17,18 | ආයු Expo – 2014 ප්‍රදර්ශනය - රාජගිරිය දේශීය වෛද්‍ය විද්‍යායතනය |
| 2014.12.24-2014.12.28 | රන්ඩිල්ස් ප්‍රදර්ශනය හා සැණකෙළිය - 2014 මහනුවර ගැටඹේ ක්‍රීඩාංගනය |

**කොළ කැඳ කට්ටල හා ඔසු උයන් කට්ටල ලබාදීම**

2014.03.06 දින බණ්ඩාරවෙල විශාඛා විදුහලට කොළ කැඳ කට්ටලයක් ලබා දී ඇත. 2014.09.19 කැලණිය, බරණැස්කන්ද පුරාණ විහාරය සඳහා ඔසු උයන් කට්ටලයක් ලබා දී ඇත.

**පොත් කට්ටල ලබා දීම**

2014.02.10 - බුලත්සිංහල ශ්‍රී ඥාණාලෝක මහ පිරිවෙණ
2014.03.13 - දේශිය වෛද්‍යවරුන් දැනුවත් කිරිමේ වැඩසටහන, කතරගම
2014.03.12 - වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව
2014.03.04 - බණ්ඩාරවෙල විශාඛා විදුහල
2014.05.21 - සබරගමුව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව පොත් කට්ටල 28
2014.07.04 - බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය

**2014.07.07 - Ayur-Ex Kandy – 2014** පාරම්පරික වෛද්‍යවරුන්ට බෙදා දීම සඳහා පොත් කට්ටල 750

2014.08.29 - ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය

2014.10.10 - අනුරාධපුර ශ්‍රී බෝධි දක්ෂිණාරාමය

2014.12.10 - ගාල්ල මහින්ද විද්‍යාලය

2014.10.06 - මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය පොත් කට්ටල 35

**නොමිලේ ඖසු පැළ ලබා දීම**

දේශීය ඖෂධ වගාව ව්‍යාප්ත කිරීමේ අරමුණින් ආයුර්වේද කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව පාසැල්. රාජ්‍ය ආයතන වලින් ලැබෙන්නාවූ ඉල්ලීම් සඳහා ඔසු පැළ 25 බැගින් නොමිලේ ලබාදීමට කටයුතු කරනු ලැබේ.




**ඉදිකිරීම්, අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු**

ප්‍රධාන කාර්යාලයේ රියදුරු නිල නිවාස අලුත්වැඩියාව අවසන් කර ඇති අතර එහි භෞතික ප්‍රගතිය 100%කි. බොරැල්ල ආයුර්වේද රෝහල ඇතුළු අනෙකුත් රෝහල් සියල්ලෙහිම ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින අතර දේශිය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ ආපනශාලාව සමඟ ශ්‍රවණාගාරය සහ නව වැසිකිලි පද්ධතිය ඉදි කිරීම දෙවන අදියරේ කටයුතු නිම කර ඉංජිනේරු අංශය වෙත භාර දී ඇත. එහි භෞතික ප්‍රගතියද 100%කි. මීට අමතරව ඔසු උයන් 7හි අළුත්වැඩියා හා ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

**3. ශිල්පීය අංශය**

ආයුර්වේද දෙපාර්තමේන්තුව 2015 වර්ෂය තුළ ආයුර්වේද රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන හා අනෙකුත් ලියාපදිංචි කටයුතු වලින් රුපියල් 1,783,900.00ක් ද, යෝග සංග්‍රහ කමිටුවේ ගාස්තු අයකිරීම මඟින් රුපියල් 1,049,800.00ක මුදලක් ද වශයෙන් ආදායම් ලබා ඇති අතර වර්ෂය තුළ තීරු බදු රහිතව වියළි ඖෂධ කි.ග්‍රෑම් 2,075,280.20ක් ආනයනය කිරීම සඳහා අවසර ලබා දී ඇත.

**4. ගිණුම් ආංශය**

උත්සව /විශේෂ අත්තිකාරම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව - 2070

ආපදා ණය පහසුකම් ලැබීමට හිමිකම් කී නිලධාරීන් සංඛ්‍යාව - 1110

2014.12.31 දින දක්වා අත්තිකාරම් බී ගිණුමට සම්බන්ධව මාසික ලැබීම් රු. 28,149,770.95

2014.12.31 දින දක්වා අත්තිකාරම් බී ගිණුමට සම්බන්ධව මාසික ගෙවීම් රු. 29,153,023.50

**5. විභාග අංශය**

| ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|
| ආයුර්වේද ශාස්ත්‍රීය පරීක්ෂණය සඳහා ඉල්ලුම් පත් කැඳවීම හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | ලියාපදිංචි වූ සිසුන් ගණන- 358 |
| ආයුර්වේද ශාස්ත්‍රීය වාර්ෂික හා අතිරේක පරීක්ෂණය පැවැත්වීම හා අවසාන වසර පරීක්ෂණයෙන් සමත් වන සිසුන්ට සහතික පත්‍ර ප්‍රදානය කිරීම | සහභාගි වූ සිසුන් ගණන - 488 |
| ලංකා සිද්ධ වෛද්‍ය විද්‍යාලයේ අවසාන වසර සිසුන් සඳහා විභාග පැවැත්වීම (දෙමළ මාධ්‍ය) | 2014 පරීක්ෂණය සඳහා සහභාගී වූ සිසුන් ගණන - 12 |
| ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන සහකාර නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 2014 සහභාගී වූ අයදුම්කරුවන් සංඛ්‍යාව - අප්‍රේල් 06, ඔක්තොම්බර් - 02 |
| ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීම | 2014 සහභාගී වූ අයදුම්කරුවන් සංඛ්‍යාව - අප්‍රේල් 235, ඔක්තොම්බර් - 193 |
| උපස්ථායක, ඖෂධ සංයෝජක, සම්බාහන පාඨමාලා සහ පංචකර්ම උසස් සහතික පත්‍ර පාඨමාලාව ආදියට අදාළ වන අවසාන ඇගයීම් පරීක්ෂණ පැවැත්වීම | • 2014 අගෝස්තු මස පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇත.<br>• සම්බාහන ප්‍රතිඵල නිකුත් කළ සංඛ්‍යාව - 23<br>• උපස්ථායක ප්‍රතිඵල නිකුත් කළ සංඛ්‍යාව - 95 |
| ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වූ ජ්‍යොතිෂ්‍ය පාඨමාලාවේ අවසාන ඇගයීම් පරීක්ෂණය පැවැත්වීම | • ප්‍රතිඵල නිකුත් කර ඇත<br>• 2014 මාර්තු සිසුන් ගණන - 31<br>• 2014 දෙසැම්බර් සිසුන් ගණන - 14 |
| රැස්වීම් පැවැත්වීම | • ආරෝග්‍ය ශාලා මණ්ඩල රැස්වීම් වාර - 07<br>• විභාග පාලක රැස්වීම් - 04<br>• අනු කමිටු රැස්වීම් - 03 |
| ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරුවලට බඳවාගැනීම හා උසස් කිරීම සඳහා විභාග පැවැත්වීම | ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීම් |
| ආයුර්වේද ශාස්ත්‍රීය පාඨමාලා පැවැත්වීම සඳහා ආයුර්වේද විද්‍යාල පවත්වාගෙන යාම හා එම විද්‍යාල සඳහා වර්ෂිකව ආධාර මුදල් ප්‍රදානය කිරීම- රු. රු.2,050,000 | දේශීය වෛද්‍ය ක්‍රමය දිවයින පුරා ප්‍රචලිත කිරීම හා ගුණාත්මක වෛද්‍යවරුන් බිහි කිරීම |

## (2) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල



ආරම්භය - 1929 ඇඳන් සංඛ්‍යාව - 195

දිස්ත්‍රික්කය - කොළඹ වෛද්‍ය නිලධාරීන් - 116

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය - තිඹිරිගස්යාය
හෙද නිලධාරීන් - 30
වාට්ටු ගණන - 14

අනෙකුත් කාර්යය මණ්ඩලය - 238

- **රෝගී සංඛ්‍යා ලේඛන - 2014**

  බාහිර රෝගීන් ගණන - 214,235

  බාහිර රෝගී අංශය විවෘතව පැවති දින ගණන - 344

- **නේවාසික රෝගී සංඛ්‍යා ලේඛණ - 2014**

  ඇතුළත් වූ රෝගීන් සංඛ්‍යාව - 1724

**පැවැත්වූ සායන**


| සායනය | සහභාගී වූ රෝගීන් ගණන |
|---|---|
| පාර්ලිමේන්තු සායනය | 1736 |
| පොලිස් ක්ෂේත්‍ර බලකා සායනය | 2465 |
| හෙල්ප්ඒජ් | 584 |
| පොදු සායනය | 32,945 |

මීට අමතරව පවත්වනු ලබන අනෙකුත් සායන 13ක් සඳහා රෝගීන් 86,273ක් 2014 වර්ෂය පුරා සහභාගී වී ඇත.

**ඖෂධ නිෂ්පාදන ධාරිතාවය**

| | | | |
|---|---|---|---|
| 1. තෛල | බෝතල් 8,238 | 6. වටී | කි.ග්‍රෑ. 34.64 |
| 2. ක්වාත | බෝතල් 50,433 | 7. ගුග්ගුළු වටී | කි.ග්‍රෑ. 10.4 |
| 3. ආසව වර්ග | බෝතල් 6,022 | 8. අරිෂ්ඨ | බෝතල් 3,905 |
| 4. පත්තු | කි.ග්‍රෑ. 468.1 | 9. චූර්ණ වර්ග | බෝතල් 4,265.7 |
| 5. කල්ක | බෝතල් 380 | | |

## (3) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල (ශික්ෂණ) - යක්කල




ආරම්භය - 1984 ජූනි

දිස්ත්‍රික්කය - ගම්පහ

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - ගම්පහ

නේවාසික ප්‍රතිකාර සඳහා ඇති වාට්ටු ගණන - 4

ඇඳන් සංඛ්‍යාව - 107

වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාාව - 14

හෙද නිලධාරීන් සංඛ්‍යාව - 15

අනෙකුත් සේවක - 62

**රෝගී සංඛ්‍යා ල්බන**

බාහිර රෝගීන් ගණන - 59,919

නේවාසික රෝගීන් සංඛ්‍යාව - 23,136

ජොෂ්ඨ පුරවැසි සායන රෝගීන් සංඛ්‍යාව - 684

ජංගම සායන සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව - 3,151

**<u>නිෂ්පාදන ධාරිතාව</u>**

1' ක්වාත වර්ග -16 - බෝතල් 10,978
2. පාණ්ඩ වර්ග -30 - කි.ග්‍රෑ. 2,324
3. චූර්ණ වර්ග - 16 - කි.ග්‍රෑ 959
4. ආසව වර්ග - බෝතල් 669

5. තෛල වර්ග - බෝතල් 1645 1/2

- ❖ සර්ෂපාදි තෙල් - බෝතල් 743 1/2
- ❖ පිණ්ඩතෙල් - බෝතල් 543
- ❖ නීලායාදිය තෙල් - බෝතල් 203
- ❖ නිර්ගුණ්ඩියාදි තෙල් - බෝතල් 1551/2

6. ගෝක්ෂුරාදි ගුගුල් - කි.ග්‍රෑ 55.660
7. කෛශෝර ගුගුල් - කි.ග්‍රෑ 5.650
8. නවරත්න කල්කය - කි.ග්‍රෑ 66.350
9. ලාක්ෂාදිලේප - කි.ග්‍රෑ 50.250

නේවාසික රෝගීන් සඳහා දෛනිකව අවශ්‍ය වන කසාය, පත්තු, මැල්ලුම් සහ ලේප වර්ග නිෂ්පාදනය කරනු ලබයි.

**(4) ආයුර්වේද ශික්ෂණ රෝහල - කයිතඩි**



බාහිර රෝගී අංශය විවෘත කළ දිනය - 1973.06.29
වාට්ටු සංකීර්ණය විවෘත කළ දිනය - 1978.10.02
වාට්ටු සංඛ්‍යාව - 5
ඇඳන් සංඛ්‍යාව - 150
වෛද්‍ය නිලධාරීන් - 10
අනෙකුත් සේවක සංඛ්‍යාව - 47

**රෝගී සංඛ්‍යා ල්ඛන**

- o බාහිර රෝගීන් සංඛ්‍යාව - 31,546
- o නේවාසික රෝගීන් සංඛ්‍යාව - 959
- o විවිධ සායන සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව - 9,198

**විවධ සායන මඟින් ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව**

| සායනය | රෝගීන් සංඛ්‍යාව | සායනය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| වැඩි හිටි සායනය | 3,426 | වෛද්‍ය සායන | 1,051 |
| විශේෂ ප්‍රතිකාර | 1,986 | කටු චිකිත්සා | 8 |
| නාරිවේදී | 221 | ජංගම සායන | 1,206 |
| දියවැඩියාව | 533 | විශ්ව විද්‍යාල | 537 |
| ළමා | 238 | | |

**ඖෂධ නිෂ්පාදනය**

2014 වර්ෂය තුළ කයිතඩි ආයුර්වේද ශික්ෂණ රෝහල තුළ චූර්ණ වර්ග කි.ග්‍රෑම් 483.25ක්ද ගුලි වර්ග කිලෝ ග්‍රෑම්7.65ක්ද, තෛල වර්ග බෝතල් 1154ක්ද නිෂ්පාදනය කර ඇත.

**(5) මන්වන්තුඩුව ආයුර්වේද රෝහල**

**සේවක සංඛ්‍යා තොරතුරු**

කාර්ය භාර වෛද්‍ය නිලධාරීන් - 01

වෛද්‍ය නිලධාරීන් - 04

උපස්ථායක - 01

සාමාන්‍ය කම්කරු - 03

**(6) අම්පාර ආයුර්වේද රෝහල**

2009 අගෝස්තු මස 19 වෙනි දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණයකට අනුව නැගෙනහිර පළාත් සභාව සතු අම්පාර ආයුර්වේද රෝහල 2009.12.01 දින මධ්‍යම රජයේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට පවරා ගන්නා ලදි.

වාට්ටු සංඛ්‍යාව - 02

ඇඳන් සංඛ්‍යාව - 24

රෝහල් අධ්‍යක්ෂ - 01

වෛද්‍ය නිලධාරීන් - 03

පාරම්පරික වෛද්‍ය නිලධාරීන් - 03

අනෙකුත් - 27

**රෝගී සංඛ්‍යා ලේඛන**

- බාහිර රෝගී අංශය

  ආයතනය විවෘතව පැවති දින ගණන - 308

  පළමු පැමිණීම - 16,600

  නැවත පැමිණීම - 13,499

  සායනික දෛනික පැමිණීම - 1,205

  බාහිර රෝගීන් සඳහා නිකුත් කළ ඖෂධවල වටිනාකම රුපියල් 4,307,768.46 ක් වේ.

- **<u>නේවාසික රෝගී සංඛ්‍යා ලේඛන</u>**

  ඇතුළත් වූ රෝගීන් සංඛ්‍යාව - 230

  පිටව ගිය රෝගීන් සංඛ්‍යාව - 225

නේවාසික රෝගීන් සඳහා නිකුත් කළ ඖෂධවල වටිනාකම රුපියල් 457,997.86 ක් වේ.

**නිෂ්පාදන ධාරිතාවය**

| **<u>ඖෂධ වර්ගය</u>** | | **<u>ප්‍රමාණය(මි.ලී.750 බෝතල්)</u>** |
|---|---|---|
| ත්‍රිපලා ක්වාතය | - | 37 |
| රාස්නා සප්තක ක්වාත | - | 356 4/3 |
| සර්පතේ සෝල් | - | 5 1/2 |
| සර්ෂපාදී තෛලය | - | 576 |

අම්පාර ආයුර්වේද රෝහල මඟින් රෝගීන්ට ප්‍රතිකාර කිරීම අරමුණු කර ගනිමින් 2014 වර්ෂයේ ස්ථාන 13කදී, දින 35ක් තුළ විශේෂ සායන පවත්වා රෝගීන් 2366ක් සඳහා ප්‍රතිකාර ලබා දී ඇත.

**7.සිද්ධ වෛද්‍ය ශික්ෂණ රෝහල - ත්‍රිකුණාමලය**

**සේවක සංඛ්‍යා තොරතුරු**

| | |
|---|---|
| වෛද්‍ය නිලධාරීන් - | 04 |
| හෙද නිලධාරීන් - | 02 |
| කම්කරුවන් - | 06 |
| මුරකරු - | 02 |

2014 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා බාහිර රෝගී අංශයෙන් රෝගීන් 12,835ක් ප්‍රතිකාර ලබා ඇත.

**(8**) **බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය**




**රෝහලේ ඉතිහාසය**

| | |
|---|---|
| ආරම්භය | - 1962.10.14 |
| දිස්ත්‍රික්කය | - කොළඹ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | - මහරගම |
| නේවාසික ප්‍රතිකාර ලැබීම සඳහා ඇති වාට්ටු ගණන | - 4 |
| ඇඳන් සංඛ්‍යාව | - 68 |

**කාර්ය මණ්ඩල තොරතුරු**

| | |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| වෛද්‍ය නිලධාරීන් | 28 |
| හෙද/හෙදි නිලධාරීන් | 11 |
| සම්බාහන | 01 |
| භෛෂජ්ජක | 02 |
| අනෙකුත් නිලධාරීන් | 79 |

2014 වර්ෂයේ මාස 12 තුළ බාහිර රෝගී අංශයෙන් රෝගීන් 68,345 ක් ප්‍රතිකාර ලබා ඇති අතර නේවාසිකව ප්‍රතිකාර ලැබූ රෝගීන් ගණන 1127කි.

**ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන අංශයේ ප්‍රගතිය**

- ඖෂධ සංස්ථාව මගින් එවන ලද මී පැණි, තල තෙල්, කොහොඹ තෙල්, ගිතෙල් හා පොල්තෙල් සාම්පල පරීක්ෂා කොට විශ්ලේෂණ වාර්තා ලබා දීම.
- දේශීය වෛද්‍ය ආයතනයෙන් පශ්චාත් උපාධි හදාරන ආයුර්වේද වෛද්‍යවරුන්ගේ පර්යේෂණ ව්‍යාපෘතිවලදී යොදා ගන්නා අමුද්‍රව්‍ය සඳහා ප්‍රමිතිය පරීක්ෂා කොට ප්‍රමිති වාර්තා ලබා දීම.
- සුරා බදු දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන ලද ආයුර්වේද ඖෂධ නිර්දේශක සඳහා විශ්ලේෂණ වාර්තා ලබා දීම.
- ගබඩාවෙන් හා ඖෂධ නිෂ්පාදනයෙන් ලැබෙන අමු ඖෂධ සාම්පලවල ප්‍රමිතිය පරීක්ෂා කර ප්‍රමිති වර්තා ලබා දීම.
- ආයුර්වේද වෛද්‍යවරුන්ගේ පර්යේෂණ ව්‍යාපෘතීන්හි රසායනික විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
- දේශීය වෛද්‍ය ආයතනයන්හි උපාධිය හදාරන සිසුන් සඳහා ආයුර්වේද ඖෂධ ප්‍රමිතිකරණ හා තත්ත්ව දේශන පැවැත්වීම.

**උද්භිද විද්‍යා අංශයේ ප්‍රගතිය**

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| ඖෂධීය ශාක හඳුනා ගැනීම<br><br>වියළි ශාකාගරය යාවත්කාලීන කිරීම | **50%** |
| ඔසු උයනේ ස්ථාපිත ඖෂධීය ශාක සඳහා දත්ත බැංකුවක් සැකසීම | **50%** |
| වියළි අමුද්‍රව්‍ය හඳුනාගැනීම<br><br>ඖෂධීය අමුද්‍රව්‍ය ලෙස පොතු වර්ග භාවිතා වන ශාක 3ක නිවැරදිව අස්වනු නෙලීම සහ සැකසීම පිළිබඳ පර්යේෂණ<br><br>කුඹුක්, මාදං, මූණමල් | **70%** |
| මතභේදාත්මක ඖෂධීය ශාක අතරින් බිං අවරිය, හීංනෙරංචි හා ඇත්නෙරංචි පිළිබඳ රූප විද්‍යාත්මක හා රසායන විද්‍යාත්මක විශ්ලේෂණ | **25%** |
| වගා පර්යේෂණ | **80%** |
| | **40%** |
| ව්‍යාප්ති සේවා | වැඩසටහන් **55** පවත්වා ඇත. |

**මිලියන 300 ව්‍යාපෘතිය**

1. පර්යේෂණ සඳහා විෂයානුබද්ධ විද්‍යාගාර 6ක් ස්ථාපිත කිරීම තුළින් පැරණි විද්‍යාගාර අළුත්වැඩියා කිරීම හා යාවත්කාලීන කිරීම

2. විෂයානුබද්ධ විද්‍යාගාර 6 සඳහා අවශ්‍ය විද්‍යාගාර උපකරණ 55ක් මිලදී ගැනීම

3. විෂයානුබද්ධ විද්‍යාගාර 6 ක් ස්ථාපිත කිරීමට අවශය අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම.

4. අදාළ විද්‍යාගාර කාර්යය මණ්ඩල බඳවාගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කර අවසන් කිරීම.

5. අපේක්ෂිත පර්යේෂණ ආරම්භ කිරීම සඳහා අදාළ කාර්යය මණ්ඩල සවි බලගැන්වීම සඳහා සහ මූලික තොරතුරු සකස් කිරීම වැනි කරුණු පදනම් කරගෙන වැඩසටහන් 45ක් පැවැත්වීම.

6. රස ඖෂධ භාවිතය වකුගඩු රෝග සඳහා හේතු කාරක වන බවට මතයක් පැවතුන බැවින් සීතාරාම වටී, මෘතුංජය වටී, බුද්ධරාජ කල්කය, සහ වජ්රක්ෂාර යන ආයුර්වේද රස ඖෂධ 4ක් සඳහා ක්‍රියාකාරීත්වය සහ විශේෂත්වය සෙවීම් පර්යේෂණ 4ක් ආරම්භ කිරීම.

7. සාහිත්‍ය විමර්ශන අංශයේ ඇති පැරණි පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා එම අංශ නවීකරණය සහ අදාළ පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම.

* පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම
* පුස්කොළ පොත් ගබඩා කිරීමට අවශ්‍ය විශේෂිත අල්මාරි මිලදී ගැනීම
* අදාළ තොරතුරු ගබඩා කර තැබීම සඳහා පරිගණක, පරිගණක මෙවලම් හා උපකරණ මිලදී ගැනීම

8. දැනට ආයතනයේ පවතින පැරණි වෛද්‍ය පුස්කොළ ග්‍රන්ථ 2ක් ලෝක උරුමයන් ලෙස නම් කිරීම.

**2014 වර්ෂයේ නිෂ්පාදනාගාරයේ ඖෂධ නිෂ්පාදනය**

| ඖෂධ වර්ගය | නිෂ්පාදන එකතුව | නිෂ්පාදන වියදම් එකතුව (රු) |
|---|---|---|
| ක්ෂාය පත | 17047 | 1,169,827.61 |
| තැම්බූ වතුර බෝතල් | 13977 | 511,543.82 |
| අනුපාන බෝතල් | 1284.94 | 69,738.40 |
| පත්තු කි.ග්‍රෑ. | 327.96 | 138,776.97 |
| ධූම කි.ග්‍රෑ. | 69.25 | 1,289.50 |
| පොට්ටනි | 159 | 13,175.19 |
| නේත්‍ර බිංදු බෝතල් | 155 | 22,561.08 |
| අක්ෂි වර්ති | 4034 | 3,654.6 |
| චූර්ණ කි.ග්‍රෑ. | 4150.19 | 801,758.38 |
| තෛල බෝතල් | 1608 | 750,854.01 |
| ආසව බෝතල් | 4859 | 516,823.71 |
| ක්වාථ බෝතල් | 41366 | 740,451.55 |
| වටී කි.ග්‍රෑ. | 44 | 27,138.48 |
| ලේහ කි.ග්‍රෑ. | 17047 | 7,048.13 |

## (9) චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල



රෝහලේ ආරම්භය - 2010.10.31

වාට්ටු ගණන - 02

ඇඳන් සංඛ්‍යාව - 137

මූල්‍ය ප්‍රතිපාදන - ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රධාන රු.මිලියන **110.5**

**කාර්ය මණ්ඩල තොරතුරු**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | - | 01 |
| වෛද්‍යවරු | - | 10 |
| හෙද නිලධාරීන් | - | 05 |
| සංවර්ධන නිලධාරීන් | - | 02 |
| උද්‍යාන කොන්දොස්තර (වැ.බ) | - | 01 |
| සුළු සේවා පාලක (වැ.බ) | - | 01 |
| ඖෂධ සංයෝජක (වැ.බ) | - | 01 |
| රියදුරු | - | 01 |
| ආයුර්වේද සේවා සහායක | - | 23 |
| එකතුව | | 45 |

**රෝගී සංඛ්‍යා ලේඛන**

2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා බාහිර රෝගී අංශයෙන් රෝගීන් 21,579ක ප්‍රමාණයක් ප්‍රතිකාර ලබා ඇති අතර නේවාසික රෝගී පිරිමි 399ක් හා ගැහැණු 390ක් වශයෙන් 789ක ප්‍රමාණයක් ප්‍රතිකාර ලබාගෙන ඇත.

**වාර්ෂික ඖෂධ නිෂ්පාදනය - 2014**

| ඖෂධ වර්ග | නිෂ්පාදන ප්‍රමාණය | ඖෂධ වර්ග | නිෂ්පාදන ප්‍රමාණය |
|---|---|---|---|
| ක්වාත වර්ග (බෝතල්) | 2874.75 | ලේප වර්ග (කි.ග්‍රෑම්) | 94.12 |
| තෛල වර්ග (බෝතල්) | 1304.72 | කල්ක (කි.ග්‍රෑම්) | 50.2 |
| පැණි වර්ග (බෝතල්) | 790 | බාම් (කි.ග්‍රෑම්) | 44.5 |
| චූර්ණ වර්ග (කි.ග්‍රෑම්) | 536.25 | ලේහ (කි.ග්‍රෑම්) | 28.3 |
| ගුලි වර්ග (ග්‍රෑම්) | 1.225 | නේත්‍රා බංදු (මි.ලී) | 1.2 |

(10) දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය



**දැක්ම**

ඉදිරි දශකයට දැනුමෙන් පිරිපුන්, කුසලතා පූර්ණ දේශීය වෛද්‍ය ප්‍රජාවක් බිහි කරලීම

**මෙහෙවර**

ආයුර්වේදීය මානව සම්පත් සංවර්ධනයේ විශිෂ්ඨතම ආයතනය බවට පත්වීම

**කාර්ය මණ්ඩල තොරතුරු - 2014**

| | |
|---|---|
| අධ්‍යක්ෂ - | 01 |
| සහකාර අධ්‍යක්ෂ - | 01 |
| පරිපාලන නිලධාරී (වැ.බ) - | 01 |
| වෛද්‍ය නිලධාරී - | 08 |
| කථිකාර්ය (අධ්‍යාපන ගණය) - | 05 |
| සංවර්ධන නිලධාරී - | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර - | 04 |
| පුස්තකාලාධිපති - | 01 |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය ක්‍රියාකරු - | 01 |
| සාමාන්‍ය කම්කරු - | 09 |

**වෛද්‍ය නිලධාරී පුහුණු වැඩසටහන්**

| අනු අංකය | වැඩසටහන | පුහුණු සංඛ්‍යාව (වෛද්‍ය නිලධාරීන්) | මූල්‍ය ප්‍රගතිය (රු) |
|---|---|---|---|
| 01 | නවක වෛද්‍ය නිලධාරී පුහුණු වැඩසටහන | 172 | 827,432.00 |
| 02 | පංච කර්ම පුහුණු වැඩසටහන | 119 | 328,500.00 |
| 03 | ඖෂධ පැළැටි පුහුණු වැඩසටහන | 82 | 206,069.00 |
| 04 | අත් පත්‍රිකා සංස්කරණ වැඩමුළුව | 30 | 22,600.00 |
| 05 | සීමාවාසික වෛද්‍ය නිලධාරී ඇගයීම | 326 | 353,500.00 |
| 06 | ආයුර්වේදාත්මක හා නව්‍ය විද්‍යාත්මක රෝග විනිර්ණය පිළිබඳ වැඩමුළුව | 88 | 84,700.00 |
| 07 | ඵලදායී බෙහෙත් සකස් කිරීම පිළිබඳ පුහුණුව | 24 | 28,350.00 |
| 08 | හස්තසාර භග්න චිකිත්සා යෝගික පුහුණුව | 4 | 24,700.00 |
| 09 | ජෝතිෂ්‍ය පාඨමාලා | 6 | 6,600.00 |
| 10 | යෝග පුහුණු වැඩමුළුව | 20 | 33,836.00 |
| 11 | වෛද්‍ය වෘත්තිය හා නීතිමය වගකීම | 34 | 42,750.00 |
| 12 | ආයතන හා කළමනාකරණ පුහුණු වැඩසටහන | 24 | 25,200.00 |
| 13 | 2013 පැවති ජෝතිෂ්‍ය පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානය | 25 | 5,800.00 |
| 14 | සීමාවාසික මෙහෙයුම් කාර්යය සංග්‍රහය සංශෝධනය | 12 | 15,300.00 |

**පාරම්පරික වෛද්‍ය නිලධාරී පුහුණු වැඩසටහන්**

| අනු අංකය | වැඩසටහන | සහභාගී වූ නිලධාරීන් | මූල්‍ය ප්‍රගතිය (රු) |
|---|---|---|---|
| 01 | ඖෂධ පැළැටි පුහුණු වැඩසටහන | 100 | 178,371.00 |
| 02 | නවක ලියාපදිංචි පාරම්පරික වෛද්‍ය පුහුණුව | 168 | 167,600.00 |
| 03 | නවක ලියාපදිංචි ආයුර්වේද ශාස්ත්‍රී වෛද්‍යවරුන් සමාජානුගතකිරීම | 22 | 24,500.00 |
| 04 | නවක ලියාපදිංචි ආයුර්වේද ශාස්ත්‍රී වෛද්‍ය පුහුණුව | 34 | 31,500.00 |
| 05 | ආයුර්වේද ශාස්ත්‍රී සිසුන් සඳහා පුනරීක්ෂණ | 90 | 189,800.00 |
| 05 | ආයුර්වේද ශාස්ත්‍රී සිසුන් සඳහා පුනරීක්ෂණ | 90 | 189,800.00 |
| 06 | වෛද්‍ය වෘත්තිය හා නීතිමය වගකීම | 58 | 91 400.00 |

**හෙද හා අනෙකුත් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්**

| අනු අංකය | වැඩසටහන | සහභාගී වූ නිලධාරීන් | මූල්‍ය ප්‍රගතිය (රු) |
|---|---|---|---|
| 01 | හෙද පුහුණු පාඨමාලා | 126 | 904,200.00 |
| 02 | සම්බාහන පුහුණු පාඨමාලා | 43 | 375,715.00 |
| 03 | කණිෂ්ඨ කාර්යය මණ්ඩල පුහුණුව | 69 | 103,000.00 |
| 04 | සේවාස්ථ හෙද පුහුණු වැඩසටහන | 11 | 16,300.00 |
| 05 | දියවැඩියා රෝගය වළක්වාලීම, පාලනය සඳහා රාජය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 101 | 16,750.00 |
| 06 | ඖෂධ පැළැටි පුහුණු වැඩසටහන | 31 | 67,781.00 |
| 07 | නවක සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 95 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් මූල්‍ය වියදම දරණ ලදී |


**ප්‍රජා සෞඛ්‍ය/මාතෘ හා ළමා පෝෂණ පුහුණු වැඩසටහන්**

| අනු අංකය | වැඩසටහන | සහභාගී වූ නිලධාරීන් | මූල්‍ය ප්‍රගතිය (රු) |
|---|---|---|---|
| 01 | පුද්ගල ඵලදායීතා වැඩසටහන් | 187 | 187,200.00 |
| 02 | පාසල් ළමුන් සඳහා පෝෂණ වැඩසටහන | 100 | 5,000.00 |
| 03 | පෝෂණ වැඩමුළුව හා ප්‍රදර්ශනය | 530 | 43,460.00 |
| 04 | සමාජ විද්‍යාත්මක පර්යේෂණ පුහුණුව | 100 | 72,500.00 |
| 05 | ජාත්‍යන්තර ගැහැණු දරුවාගේ දින සැමරුම් වැඩසටහන | 100 | 16,100.00 |

## (11) ආයුර්වේද ඔසු උයන්

සජීවී ශාකාගාරයක් ලෙස පවත්වාගෙන යාම, (ඖෂධීය ශාක විශේෂ රාශියක් එක් ස්ථානයක වගා කිරීම) ඖෂධීය පැළෑටි සංරක්ෂණය කිරීම සහ ආදර්ශ ඔසු පැළ තවාන් ඇති කිරීම හා වගා පර්යේෂණ සිදු කිරීමේ අරමුණ ඇතිව ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ඔසු උයන් ආරම්භ කරන ලදී. මේ වන විට දෙපාර්තමේන්තුව යටතේ ආයුර්වේද ඔසු උයන් 7ක් පාලනය වේ.

**නාවින්න - බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතන ඔසු උයන**



| | |
|---|---|
| මුළු අක්කර ගණන - | 15 |
| වගා කර ඇති අක්කර ගණන - | 15 |
| සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව - | කොන්ත්‍රාත් 3 |

ඔසු පැල වාර්තාව - 2014

| මාසය | නිෂ්පාදනය කළ පැල සංඛ්‍යාව | අලෙවි කළ පැල සංඛ්‍යාව | අලෙවි ආදායම (රු) | නොමිලේ නිකුත් කළ පැල ගණන | නොමිලේ නිකුත් කළ පැලවල වටිනාකම (රු) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 1500 | 768 | 36,370.00 | 1249 | 37,470.00 |
| පෙබරවාරි | 1695 | 355 | 18,510.00 | 75 | 8,250.00 |
| මාර්තු | 750 | 818 | 45,945.00 | 279 | 9,090.00 |
| අප්‍රේල් | 1000 | 406 | 18,560.00 | 200 | 6,000.00 |
| මැයි | 820 | 823 | 37,490.00 | 165 | 4,950.00 |
| ජුනි | 850 | 632 | 25,680.00 | 225 | 6,750.00 |
| ජූලි | 966 | 540 | 22,950.00 | 524 | 16,980.00 |
| අගෝස්තු | 186 | 676 | 25,299.00 | 29 | 910.00 |
| සැප්තැම්බර් | 508 | 1002 | 33,150.00 | 314 | 9,480.00 |
| ඔක්තෝබර් | 670 | 720 | 24,490.00 | 275 | 8,490.00 |
| නොවැම්බර් | 425 | 313 | 11,375.00 | 350 | 10,640.00 |
| දෙසැම්බර් | 687 | 617 | 20,400.00 | 125 | 3,770.00 |
| **එකතුව** | **10057** | **7670** | **320,219.00** | **3810** | **122,780.00** |

**හල්දුම්මුල්ල - ජාතික පර්යේෂණ ඔසු උයන ( මලිත ඔසු උයන)**

මුළු අක්කර ගණන - 65
වගා කර ඇති අක්කර ගණන - 63
සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව - 63

| වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රතිලාභ |
|---|---|
| පාංශු සංරක්ෂණය සඳහා ගල් වැටි අළුත්වැඩියා කර සජීවී ශාක වැටි හා කාණු දැමා සජීවී ශාක සඳහා නික, ආඩතෝඩා, සැවැන්දරා සිටුවා ඇත. | මෙමඟින් සෝදා පාළුවට ලක්වන බෑවුම් සහිත ඉඩම් කොටස් සංවර්ධනය කිරීම |
| **පැල නිෂ්පාදනය-**<br>▪ වීදුරු ගෘහය තුළ හා තවානේ පැල නිෂ්පාදනය - 28156<br>▪ දිවි නැඟුම පැළ සඳහා නිෂ්පාදනය කළ පැල ගණන - 1650<br>▪ මුදලට නිකුත් කළ පැල ගණන - 14391(එහි වටිනාකම - රු. 590,662.00)<br>▪ නොමිලේ ලබා දුන් පැල ගණන - 16,619 (එහි වටිනාකම - රු. 534,745.00) | දිවි නැඟුම වැඩ සටහනට පැල සැපයීම තුළින් දායකත්වය සැපයීම<br>පැල අලෙවිය වැඩිදියුණු කිරීම |
| අක්කර 4ක වගා නොකළ ඉඩම් වල් මර්ධනය කොට පැල සිටුවා සංවර්ධනය කර ඇත | වගා නොකළ ඉඩම් කොටසේ අක්කර 2ක ප්‍රමාණය සංවර්ධනය කිරීම |
| ආයතනයේ නඩත්තු කටයුතු<br>▪ ක්ෂේත්‍රයේ වල් නෙළීම, තණකොළ කපන යන්ත්‍ර මඟින් තණකොළ කපා සංවර්ධිත කොටස් නඩත්තු කිරීම<br>▪ අඩි පාරවල් ශුද්ධ පවිත්‍ර කිරීම<br>▪ ආයතනයේ දිවා රාත්‍රී මුර සේවාව විධිමත් කිරීම | ආයතනයේ එදිනෙදා නඩත්තු කටයුතු විධිමත් කිරීම |
| වඳවීයාමේ තර්ජනයට ලක් වී ඇති ඖෂධීය පැල වන බිං කොහොඹ පැල 2036ක් නිෂ්පාදනය කර එමඟින් නිෂ්පාදනය වැඩි කිරීම | වඳවීයාමේ තර්ජනයට ලක් වී ඇති දුර්ලභ ඖෂධ වර්ග සංරක්ෂණය කිරීම හා පැල අලෙවිය තුළින් ආදායමක් ලබා ගැනීම |
| පාසල් වැඩසටහන්<br>▪ පාසල් වැඩසටහන් මඟින් ඔසු පැල පිළිබඳ දැනුම ලබා දී ඇත.<br>▪ පාරම්පරික වෛද්‍යවරුන් හා වෙනත් පරිසර කණ්ඩායම් සඳහා හා දේශීය විදේශීය සංචාරකයින් සඳහා ඖෂධීය පැලෑටි හඳුන්වාදීම හා වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබා දීම. | මෙතුළින් ඖෂධ උද්‍යානය පිළිබඳ ජනතාව අතර අවබෝධයක් ඇති කිරීම. |

**පට්ටිපොල - කඳුලැසිය ඔසු උයන**

| | |
|---|---|
| මුළු අක්කර ගණන - | 32 |
| වගා කර ඇති අක්කර ගණන - | 32 |
| සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව - | 24 |



| වැඩසටහන | ක්‍රියාකරකම් |
|---|---|
| සංචාරක නිවාසය අසල පර්චර්ස් 40ක එළවළු වගා කිරිම | ▪ සංචාරක නිවාසය අසල කරන ලද එළවළු වගාවෙන් ලත් ආදායම - රු.4135<br>▪ දැනට අර්තාපල් වගා කර ඇති අතර, දැල් ගෘහය තුළ තක්කාලි, බීට්, නෝකෝල්, සුළු වශයෙන් වගා කර ඇත |
| උද්‍යානයේ ඉදිරිපස අක්කර 7ක කොටස අලංකාර කිරිම | ▪ ඉදිරිපස ඇති පොකුණ නවීකරණය කර ජලජ ශාක සාදා ඇත.<br>▪ මාර්ගය දෙපස කානු සුද්ද කර ජලය ගලා යාම ක්‍රමවත් කරන ලදි.<br>▪ මාර්ගය දෙපස ලොත් සුඹුල් පැල 150ක් සිටුවා කප්පාදු කර ඇත<br>▪ සයිප්‍රස් ගස් ව්‍යාප්ත කිරිමට පියවර ගෙන ඇත<br>▪ මීන ශාක සිටුවා ඇත |

| | |
|---|---|
| ඖෂධ ශාක වගා කිරීම | ▪ වද කහ අක්කර 1/2 ක වගුරු බිමක වගා කර ඇත.<br>▪ අරුද පැල අක්කර 1/4 ක පමණ සිටුවා ඇත.<br>▪ වැල් මදට හා තුවරලා සුළු වශයෙන් වගා කර ඇත<br>▪ දුර්ලභ ඖෂධීය ශාක ප්‍රදර්ශනය සඳහා වීදුරු ගෘහය තුල බදුන් ගත කර ඇත.<br>▪ සමන් පිච්ච පැල 500ක් ක්ෂේත්‍රයේ සිටුවා ඇත.<br>▪ දාරුහරිද්‍රා පැල අක්කර 2ක් සිටුවන ලදී. |
| පැල තවාන් වාර්ෂික නිෂ්පාදනය පැළ 25000කින් වැඩි කිරිම හා උද්‍යානයේ එදිනෙදා සෙසු නඩත්තු කටයුතු | ▪ දිවි නැගුම සඳහා බදුන්ගත කල පැල 6000ක් නිෂ්පාදනය කර බෙදා හැරිම<br>▪ තවාන සඳහා නව නිෂ්පාදන වශයෙන් බදුන්ගත පැල 2227ක් එකතුකර ඇත.<br>▪ ජලජ ශාක හා මසුන් ඇති කිරිම සඳහා වේල්ලක් බැද පොකුණක් බැද කහ ඕලු ස්ථාපනය කර ඇත<br>▪ අක්කර 7ක කොටස සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන පදුරු ශාක විශේෂය අක්කර 2ක් පමණ ගලවා ඉවත් කර ඇත.<br>▪ දැනට ඇස්ටමේරියා මල් වගාවක් කුඩා පරිමාණයෙන් පටන්ගෙන ඇති අතර දැනට රු.370/-ක මුදලක් ලැබී ඇත.<br>▪ විශාල කාණු යොදා ක්‍රමවත්ව සකසන ලදී.<br>▪ තවාන අසල තිබු ලිද ප්‍රතිසංස්කරණය කිරිම සහ වතුර මෝටරය තැබිම සඳහා ලිද අසල කාමරයක් සකස් කර ස්ථාන ගත කරන ලද අතර ජල නල පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරිම<br>▪ පිවිසෙන මාර්ගයේ ස්වර්ණ පිච්ච ඉදිකර වැටක් ලෙස සැදිම<br>▪ කාර්යාලය ඉදිරිපිට අලංකාර ලෙස දඩු වැටවල් යොදා මල් සිටුවා ඇත. |
| 2014 වර්ෂයේ නිකුත් කර ඇති වියලි හා අමු ඖෂධ වර්ග | ▪ දාරු හරිද්‍රා - කිලෝ.ග්‍රෑම් 502<br>▪ ලොත් සුඹුල් - කිලෝ.ග්‍රෑම් 100<br>▪ අමු වදකහ - කිලෝ.ග්‍රෑම් 82 |

**ගිරාදුරුකෝට්ටේ - රත් නිටුල ඔසු උයන**

| | | |
|---|---|---|
| මුළු අක්කර ගණන | - | 178 |
| වගා කර ඇති අක්කර ගණන | - | 98 |
| සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව | - | 36 |

**ඔසු පැල වාර්තාව - 2014**

| මාසය | නිෂ්පාදනය කල පැල සංඛ්‍යාව | අලෙවි කල පැල සංඛ්‍යාව | අලෙවි ආදායම (රු) | නොමිලේ නිකුත් කල පැල ගණන | නොමිලේ නිකුත් කල පැලවල වටිනාකම (රු) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 0 | 20 | 1,040.00 | 0 | 0 |
| පෙබරවාරි | 6 | 11 | 470.00 | 150 | 4,500.00 |
| මාර්තු | 3593 | 278 | 8,645.00 | 25 | 750.00 |
| අප්‍රේල් | 0 | 6 | 245.00 | 11 | 430.00 |
| මැයි | 4 | 98 | 3,605.00 | 0 | 0 |
| ජුනි | 0 | 75 | 2,825.00 | 0 | 0 |
| ජූලි | 2 | 31 | 1,110.00 | 0 | 0 |
| අගෝස්තු | 1 | 34 | 1,130.00 | 0 | 0 |
| සැප්තැම්බර් | 0 | 212 | 6,460.00 | 15 | 450.00 |
| ඔක්තෝබර් | 11789 | 151 | 4,730.00 | 16083 | 482,490.00 |
| නොවැම්බර් | 995 | 90 | 2,700.00 | 2125 | 63,750.00 |
| දෙසැම්බර් | 2184 | 442 | 13,680.00 | 0 | 0 |
| **එකතුව** | **18574** | **1448** | **46,640.00** | **18409** | **552,370.00** |

**පල්ලේකැලේ - ජාතික පර්යේෂණායතන ඔසු උයන**

මුළු අක්කර ගණන - 03

වගා කර ඇති අක්කර ගණන - 03

සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව - 07

| වැඩසටහන/කාර්ය/ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | ප්‍රතිලාභ |
|---|---|---|
| ඔසු පැල තවාන පැල 25000 දක්වා වැඩි කිරීම | පැළ 38611ක් නොමිලේද, පැල 7778ක් මුදලටද නිකුත් කර ඇත | ▪ ඔසු පැල අලෙවියේදී රු.344021.00ක ආදායමක් ලබා ඇත.<br>▪ නොමිලේ නිකුත් කල වටිනාකම 1,383,075.00 |
| සුදු හඳුන් පැල 3000 සැකසීම | -සුදු හඳුන් පැල 1332ක් නොමිලේ ලබා දී ඇත.<br>-මුදලට පැල 55ක් ලබා දී ඇති අතර පැළ 1387ක් නිෂ්පාදනය කර ඇත. | බීජ හිඟතාවය නිසා නිෂ්පාදනය අඩුවී ඇත. |
| පාසල් සහ රජයේ ආයතනවල ඔසු උයන් ඇති කිරීම | පාසල්, රජයේ, ආයතන විහාරස්ථානවල දැනුවත් කිරීම් | පාසල් 48ක දැනුවත් කිරීම් වැඩසටහන් 1794ක් සිදු කර ඇත. |
| ඔසු ගෙවතු වගා ඇති කිරීම | දිවිනැඟුම වැඩසටහන යටතේ ගෙවතු වගා මහනුවර හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිදු කර ඇත. | ▪ කුරුණෑගල ගෙවතු වගා වැඩසටහන් -1835<br>▪ මහනුවර ගෙවතු වගා වැඩසටහන් -1065 |

**පින්නදූව ඔසු උයන**

මුළු අක්කර ගණන - 6.5

වගා කර ඇති අක්කර ගණන - 5.75

සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව - 12

2014 වසරට අදාළව මුදලට සහ නොමිලේ නිකුත් කරන ලද ඖෂධීය රෝපණ ද්‍රව්‍ය පිළිබඳ වාර්තාව පහත පරිදිය.

| මාසය | මුදලට පැල අලෙවි කිරීම | | නොමිලේ පැල නිකුත් කිරීම | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුදල (රු) | ප්‍රමාණය | වටිනාකම (රු) |
| ජනවාරි | 261 | 10,920.00 | 1312 | 73,825.00 |
| පෙබරවාරි | 1469 | 81,190.00 | 294 | 9,075.00 |
| මාර්තු | 390 | 15,770.00 | 74 | 2,220.00 |
| අප්‍රේල් | 259 | 10,535.00 | - | - |
| මැයි | 430 | 16,720.00 | 764 | 40,740.00 |
| ජුනි | 309 | 14,285.00 | 125 | 3,845.00 |
| ජූලි | 160 | 6,500.00 | 25 | 750.00 |
| අගෝස්තු | 83 | 10,850.00 | 155 | 5,100.00 |
| සැප්තැම්බර් | 131 | 8,590.00 | 75 | 2,350.00 |
| ඔක්තෝබර් | 1787 | 88,585.00 | 16977 | 584,850.00 |
| නොවැම්බර් | 229 | 7,510.00 | 100 | 3,200.00 |
| දෙසැම්බර් | 3960 | 146,820.00 | 544 | 23,440.00 |
| **එකතුව** | **9468** | **418 275.00** | **20445** | **749,395.00** |

ඔසු උයනේ අතුරු භෝග වගාව ලෙස ගම්මිරිස්, ගස් තිප්පිලි, වෙනිවැල්, නිල් අවරිය, සහ කෙසෙල් වගා කර ඇත.

# 9. ආයුර්වේද වෛද්‍ය සභාව

1961 අංක 31 දරණ ආයුර්වේද පනත අනුව ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාව ආයුර්වේද වෛද්‍යවරු ඇතුළුව එම ක්ෂේත්‍රයට අදාළ පිරිස් සම්බන්ධව කටයුතු කිරීම හා ආයුර්වේද ක්ෂේත්‍රයේ ආයතනික සේවාවන් සඳහා උපදෙස් ලබා දීම, මඟ පෙන්වීම හා විනය පැවැත්මක් ඇති කිරීම හා ක්‍රියා කරන්නාවූ සම්භාවනීය මණ්ඩලයක් වශයෙන් ක්‍රියාත්මක වේ. ආයුර්වේද විෂයය භාර ගරු අමාත්‍යතුමා විසින් වෛද්‍ය සභාවට සාමාජිකයන් පත් කරනු ලබන අතර ඔවුන්ගේ නිල කාලය වසර තුනකි. ආයුර්වේද කොමසාරිස් නිල බලයෙන් මෙහි සභාපති වනු ඇත.

#### ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යය භාරය

ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යය භාරය වනුයේ ආයුර්වේද වෛද්‍යවරුන්,ඖෂධ සංයෝජකයින්, සාත්තු සේවකයන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි කිරීම අවලංගු කිරීම හෝ අත් හිටුවීම, වෘත්තීය හැසිරීම් විධිමත් කිරීම හා පාලනය කිරීම යනාදියයි.

#### මූල්‍ය ප්‍රසම්පාදනය

2014 වර්ෂය වෙනුවෙන් ආයුර්වේද වෛද්‍ය සභාව වෙත රුපියල් ලක්ෂ 70ක මුදලක් රජයේ ප්‍රතිපාදන වශයෙන් වෙන් කර ඇති අතර මේ වන විට රුපියල් ලක්ෂ 55ක මුදලක් ලැබී ඇත. එමෙන්ම 2014 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාව වෙත විවිධ ක්ෂේත්‍රයන් මඟින් ලැබූ ආදායම රුපියල් 13,263,790.00ක් වූ අතර මුළු වියදම රුපියල් 10,240,105.00ක් වේ.

#### විමර්ශන කටයුතු

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍ය වරුන්ගේ වෘත්තීය විෂමාචාර මෙන්ම ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිලි සොයා බලා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ මහජන විමර්ශන ඒකකයක් පිහිටුවා ඇත. එම වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා, වෘත්තීය විෂමාචාර ආයුර්වේද ආචාර ධර්මවලට පටහැනිව ක්‍රියාකිරීම ආදිය විමර්ශනය මෙහි මූලික අරමුණයි. සභාවේ මෙම කාර්යය පුවත්පත් දැන්වීම්, පැමිණිලි හා මහජන පැමිණිලි වශයෙන් වෙන්කොට විමර්ශන සඳහා යොදා ගැනේ. ඒ අනුව 2014 වර්ෂයේ අතිරේක සුදුසුකම් ඇතුළත් කොට සහතික නිකුත් කර ඇති සංඛ්‍යාව 03ක් වන අතර විමර්ශනයන් කරමින් ඇති පැමිණිලි සංඛ්‍යාව 34කි.

#### විශේෂ වෛද්‍ය මණ්ඩලය

රජයේ හා පෞද්ගලික ආයතනවල සේවයේ නියුතු සේවකයින් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXVI වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන වෛද්‍ය මණ්ඩලයට සමගාමීව ආයුර්වේද වෛද්‍ය සහතික සම්බන්ධයෙන් අදාළ විශේෂ වෛද්‍ය මණ්ඩල පවත්වනු ලැබේ. ඒ පිළිබඳව සොයා බැලීම සඳහා ඒ ඒ ආයතන මඟින් වෛද්‍ය සභාවට පොදු 142 ආකෘති පත්‍රය සම්පූර්ණ කර එවනු ලබන අතර වෛද්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව 20කි.

**පනතේ 55 (1) හා 55 (2) වගන්ති යටතේ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම**

ආයුර්වේද වෛද්‍ය සභාව පහත සඳහන් මූලික ප්‍රතිපත්ති මත වෛද්‍යවරු ලියාපදිංචිය සිදු කරයි.

- ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්, අභිඥාණපත්‍රධාරීන් සහ රජය පිළිගත් සහතිකපත්‍රධාරීන් සුදුසුකම් අනුව ලියාපදංචි කිරීම.
- ආයුර්වේද වෛදය සභාව සම්මත කරනු ලැබූ ව්‍යවස්ථාව අනුව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ අනුව සුදුසුකම්ලත් පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

2014.01.01 සිට 2014.12.31 දක්වා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව

| සාමාන්‍ය ( සර්වාංග) | 2014.12.31 දිනට |
|---|---|
| පාරම්පරික | 86 |
| බී.ඒ.එම්.එස්. ( BAMS) කොළඹ | 71 |
| බී.යූ.එම්.එස්.(BUMS) කොළඹ | 16 |
| බී.එස්.එම්.එස් (BSMS) යාපනය | 12 |
| බී.ඒ.එම්.එස් (BAMS) කැළණිය | 30 |
| බී.ඒ.එම්.එස් (BAMS) ඉන්දියාව | 3 |
| ආයුර්වේද ශාස්ත්‍රී (DA) | 54 |
| **මුළු එකතුව** | **272** |

| විශේෂ | 2014.12.31 දිනට |
|---|---|
| සර්ප විෂ | 49 |
| කැඩුම් බිඳුම් | 92 |
| අක්ෂි රෝග | 5 |
| චර්ම රෝග | 7 |
| ගෙඩි වණ | 8 |
| ජල භීතිකා | 2 |
| මානසික | 9 |
| දැවුම් පිළිස්සුම් | 1 |
| මුළු එකතුව | 173 |
| මුළු ලියාපදිංචි වෛද්‍යවරු සංඛ්‍යාව | 445 |

මියගිය බවට වාර්තා වී ඇති 81

- 2014.12.31 වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ පාරම්පරික වෛද්‍යවරුන් 5471ක්ද, ඩිප්ලෝමාධාරීන් 5210ක්ද, උපාධිධාරීන් 2322ක්ද, විශේෂ වෛද්‍යවරුන් 8501ක් හා තොරතුරු සොයා ගත නොහැකි 2545ක්ද ඇතුළුව මුළු සංඛ්‍යාව 24,049ක් ලියාපදිංචි වී ඇත.

- 2014.12.31 දිනට හෙද නිලධාරින් 30 ක්ද, භෛසජ්‍යකයින් 212 ක්ද, සත්ත්ව වෛද්‍යවරුන් 05 ක්ද ලියාපදිංචි කර ඇත.

- 2014 වසරේ පවත්වන ලද ජංගම වැඩසටහන සඳහා 438ක සහභාගීත්වයක් ලැබී ඇත.

**2014 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාවේ අනුමැතියට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් පියවර**

| අයිතමය | 2014 |
|---|---|
| මියගොස් ඇති බව දන්වා එවා ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව | 81 |
| වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදු කළ සංඛ්‍යාව (රජයේ හා පෞද්ගලික අංශයේ) | 1054 |
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම | 585 |
| වාහන නිල ලාංජන නිකුත් කිරිම (ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා) | 110 |
| දේශිය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ සහයෝගය ඇතිව නවක ලියාපදිංචි වෛද්‍යවරුන් සඳහා පවත්වන ලද මූලික වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගීත්වය | 260 |
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම | 1063 |
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා නිකුත් කරන ලද ජාත්‍යන්තර සහතික සංඛ්‍යාව | 11 |
| දේශීය හස්ති වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කරන ලද සංඛ්‍යාව | 05 |

# 10. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

**දැක්ම**

සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික හා ජාත්‍යන්තර ඖෂධ අවශ්‍යතා උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව සපුරාලන සේවය මුල්කරගත් පුරෝගාමී ආයතනයක් වීම

**මෙහෙවර**

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටුකරලමින් සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.

ආයුර්වේද ඖෂධ සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ දෙවන හා තුන්වන වගන්ති යටතේ 1969 මැයි මස 09 වන දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනයක් මඟින් 1969 වසරේ කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද්දකි.

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා නවීන තාක්ෂණික මෙවලම් යොදා ගනිමින් ඖෂධ නිෂ්පාදනයට අමතරව ඖෂධ බෙදා හැරීම, සිද්ධ සහ යූනානි වෛද්‍ය ක්‍රමය සඳහා අමුද්‍රව්‍ය ආනයනය කිරීම, වෙළඳාම හා බෙදා හැරීම, දේශීය වශයෙන් නිපදවනු ලබන ආයුර්වේද ඖෂධ අමුද්‍රව්‍ය මිලදී ගෙන ඒවායින් ඖෂධ සකස් කිරීම, ආයුර්වේද ඖෂධ සම්බන්ධ ප්‍රමිතිකරණය, ඖෂධ ගබඩා පවත්වාගෙන යාම, විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම, ආයුර්වේද ඖෂධ නිපදවීමට අවශ්‍ය දේශිය ඖෂධ පැළෑටි වගා කිරීම වැනි කාර්යයන්ද කරනු ලබයි.

**ආයතනික ව්‍යුහය:**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සාමාජිකයන් 07 ක් දෙනකුගෙන් යුතු අධ්‍යක්ෂ මණ්ඩලයකින් යුක්ත වන අතර ආයතනයේ ඉහළම විධායක බලතල අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. සංස්ථාවේ සභාපති ආයතන ප්‍රධානියා වන අතර ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාද වේ. ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා සාමාන්‍යාධිකාරි වන අතර ඔහු යටතේ ආයතනයේ එක් එක් අංශ භාර කළමණාකරුවන් සේවය කරයි.

**ඖෂධ අලෙවිය:**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පොදු මහජනතාව සඳහා ඖෂධ මිලදී ගැනීමට හා වෛද්‍ය සායන ප්‍රතිකාර ලබා ගැනීමට පහසු වන පරිදි දිවයිනේ ස්ථාන 15ක ඖෂධ අලෙවිසැල් පිහිටුවා ඇත.

**සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය:**

ඖෂධ නියමිත ප්‍රමිතියකින් නිෂ්පාදනය කර රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත සාධාරණ මිලකට බෙදා හැරීම ඖෂධ සංස්ථාව මඟින් සිදු කරන අතර රජයේ වනාන්තර වලින් ඖෂධ ලබා ගැනීම මේ වන විට දුෂ්කර වී ඇති අතර තහනම් පැලෑටි ලෙස ප්‍රකාශිත ඇතැම් ඖෂධ අධිකරණය භාරයට පත් වූ පසු ඖෂධ සංස්ථාව වෙත ලබා ගැනීමට කටයුත කර ඇත. 2014 වර්ෂයෙදී ඖෂධ වර්ග 150ක් පමණ නිෂ්පාදනය කර ඇති අතර එහි නිෂ්පාදන වටිනාකම රුපියල් මිලියන 270කි. ඖෂධ බෙදා හැරීම සඳහා අලෙවි නියෝජිතයන් පත් කර ඇති අතර ඔවුන් මඟින් ඖෂධ බෙදා හැරීම හා අලෙවිය සිදු වේ. 2014 වර්ෂය අවසාන වන විට පත් කර ඇති අලෙවි නියෝජිතයන ්සංඛ්‍යාව 18කි. ඖෂධ නිෂ්පාදන රාජ්‍ය අවශ්‍යතාවය සපුරනු ලබන අතර පෞද්ගලික අංශයට නිෂ්පාදනයන්ගෙන් 10%ක පමණ ප්‍රමාණයක් අලෙවි කරනු ලැබේ. 2014 වර්ෂයේ මුළු අලෙවි ආදායම රුපියල් මිලියන 445කි.

**ඖෂධ නිෂ්පාදනය:**

2014 වර්ෂයේ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ආයුර්වේද නිෂ්පාදන ඒකක වශයෙන් නිෂ්පාදනය කර ඇති ආකාරය පහත පරිදි වේ.

| ඖෂධ නාමය | ඒකකය | සත්‍ය නිෂ්පාදනය |
|---|---|---|
| අරිෂ්ඨ | මි.ලී. 750 | 149,196 |
| ආසව | මි.ලී. 750 | 105,860 |
| තෛල | මි.ලී. 750 | 171,392 |
| ක්වාථ | මි.ලී. 750 | 80,242 |
| සිරප් | මි.ලී. 750 | 18,573 |
| නව නිෂ්පාදන1 | මි.ලී. 750 | 1,495 |
| චූර්ණ | කි.ග්‍රෑ. | 24,431 |
| බාම් | කි.ග්‍රෑ. | 2,148 |
| කල්ක, ලේහ, ලේප, මෝදකය | කි.ග්‍රෑ. | 18,161 |
| නව නිෂ්පාදන 2 | කි.ග්‍රෑ. | 6,862 |
| රස, රසායනය | කි.ග්‍රෑ. | 2,505 |
| වටිකා, ගුගුල් | කි.ග්‍රෑ. | 10,166 |





**ආයතනයේ කාර්යය සාධනය ඉහළ නැංවීම පිණිස සංස්ථාව විසින් ගෙන ඇති මධ්‍යකාලීන ක්‍රියා මාර්ග**

1. වැඩිවන ඖෂධ ඉල්ලුමට සරිලන පරිදි නිෂ්පාදනය කිරීමට සංස්ථාවේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා අමුද්‍රව්‍ය හා නිමි ඖෂධ ගබඩා කිරීම සඳහා සිව්මහල් ගබඩා සංකීර්ණය ඉදි කරමින් පැවතීම

2. ඉහළ ගුණාත්මකභාවයකින් යුත් නව නිෂ්පාදන වෙළඳපළ ඉල්ලුමට සරිලන සේ නිපදවීම සඳහා වැඩි ඉල්ලුමක් පවතින රස බෙහෙත් නිෂ්පාදනය වර්ධනය කර ගැනීම සඳහා ඖෂධ නිෂ්පාදන අංශයට නව යන්ත්‍ර සූත්‍ර ලබාදීම හා නවීන තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම.

3. ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය අමු ද්‍රව්‍ය වියදම අඩු කිරීම සඳහා සංස්ථාවට අයත් නිකවැරටිය ඔසු ගොවි ව්‍යාපෘතිය ඔසු වගා කිරීම ක්‍රමවත්ව පුළුල් කිරීම.

4. නව නිෂ්පාදනාගාර ඉඩමේ පිහිටි කර්මාන්ත ශාලාව නවීකරණය කර එහි අළුතින් ඖෂධීය ගුණයෙන් යුත් නව නිෂ්පාදන ක්‍රියාත්මක කිරීම.

5. අලෙවිසැල් ආරම්භ කිරීමේදී ඒවා ජනාකීර්ණ ප්‍රදේශවල ආරම්භ කිරීම හා දැනට පවතින අලෙවිසැල් වැඩි දියුණු කිරීමට කටයුතු සැළසුම් කිරීම.

6. විශේෂයෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශ ආවරණය කරමින් අලෙවිසැල් ඇරඹීමට කටයුතු සැලසුම් කිරීම.

7. බලශක්ති වියදම අවම කර ගැනීම සඳහා සූර්ය ශක්තිය භාවිතා කිරීම.

8. නිෂ්පාදනයෙන් ඉවතලන ද්‍රව්‍යවලින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම හා ඒවා ඔසු වගාව සඳහා යොදවා ගැනීම.

**නව සිව්මහල් ගබඩා සංකීර්ණය**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ශ්‍රී ලංකාවේ දේශීය ඖෂධ නිෂ්පාදනයේ පුරෝගාමී ආයතනය වන බැවින් දැනට සංස්ථාව ඖෂධ වර්ග 150ක් පමණ නිෂ්පාදනය කරනු ලබන අතර එම නිෂ්පාදන සඳහා අමු ද්‍රව්‍ය වර්ග 350ක් පමණ යොදා ගැනේ. සංස්ථාවේ ගොඩනැගිලි වසර 40ක් පමණ පැරණි වන අතර ඇතැම් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමද ඵලදායී නොවේ. දැනට ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන අමු ද්‍රව්‍ය නිෂ්පාදිත ඖෂධ වර්ග සහ ඖෂධ ඇසිරීම සඳහා යොදා ගනු ලබන හිස් බෝතල් හා වෙනත් ඇසුරුම් ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා සංස්ථාවේ ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති බැවින් ඒ සඳහා අසීරුතාවයකින් වුවද නිෂ්පාදනාගාරයේ ඉඩ පහසුකම් ලබාදීමට සිදුව ඇත. මේ හේතුව නිසා නිෂ්පාදන ඖෂධ ගබඩා කිරීමටත් ඖෂධ නිෂ්පාදන සඳහා යොදා ගනු ලබන අමු ද්‍රව්‍ය හා අනෙකුත් ද්‍රව්‍ය සඳහා ගබඩා පහසුකම් සලසා දීමටත් නිෂ්පාදනාගාරයේ වෙන්වූ වෙනමම ගබඩා සංකීර්ණයක් පැවතීම අත්‍යාවශ්‍ය කරුණක් සේ පෙන්වා දෙමු. මේ නිසා මෙයට පිළියමක් වශයෙන් සංස්ථා පරිශ්‍රයේ මහල් 4කින් යුත් ගබඩා සංකීර්ණයක් රුපියල් මිලියන 100ක ප්‍රතිපාදන යටතේ ඉදි කිරීමට 2008.05.26 වන දින එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ අතර මේ සියළුම නිර්මාණාත්මක ඉංජිනේරුමය සැලසුම් හා ඇස්තමේන්තු 2006 වසරේදී සකස් කර ඇත. ඉදි කිරීමට යෝජිත ගබඩා සංකීර්ණයේ දිග අඩි 160ක් වන අතර පළල අඩි 36ක් වන මහල් 04හි මුළු වර්ග ප්‍රමාණය වර්ග අඩි 25,060කි. 2012 වර්ෂයේදී මෙම ගබඩා සංකීර්ණය ඉදිකිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට මුළු ඇස්තමේන්තුවෙන් 84%ක වැඩ කොටස් අවසන් වී ඇත. 2014 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 40ක ප්‍රතිපාදන ලැබී ඇති අතර 2014.12.31 වන දින වන විට වැඩ අවසන් වී ඇති සම්පූර්ණ ඉදිකිරීම් පිරිවැය රුපියල් මිලියන 78කි.

**නවීන යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම**

ඉහළ ගුණාත්මක භාවයකින් යුත් නව නිෂ්පාදන වෙළඳපල ඉල්ලුමට සරිලන සේ නිපදවීම සඳහා 2014 වර්ෂයේ උපකරණ මිලදී ගැනීමට මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 50ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. මෙම ප්‍රතිපාදන වලින් දැනට රුපියල් මිලියන 12.5ක මුදලකට යන්ත්‍ර 06ක් ආනයනය කිරීම සඳහා ණයවර ලිපි නිකුත් කර ඇත. ඉතිරි ප්‍රතිපාදන වලින්ද සංස්ථාව අවශ්‍ය නවීන යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

**ඔසු වගාවන්වල ප්‍රගතිය**

ඖෂධ නිෂ්පාදනය සඳහා ප්‍රධාන සාධකය අමු ද්‍රව්‍යයි. දේශීය වාණිජ මටට්මේ ඖෂධ නොවැවීම, වනාන්තර ආරක්ෂා කිරීමේ දැඩි නීති රීති වැඩිවන විට ඒ ආශ්‍රිත ලබා ගත යුතු ඖෂධ ලබා ගැනීමට නොහැකි තත්ත්වයකට පත් වී ඇත. මේ තත්ත්වය ඖෂධ නිෂ්පාදනය සඳහා බලපෑමක් ඇති කරන අතර දේශීය අමු ද්‍රව්‍යවල හිඟතාවය මත ලංකාවට අමු ද්‍රව්‍ය ආනයනය කරනු ලබන්නේ ඉන්දියාවෙන්ය. ඉන්දියානු රජයෙන් යම් යම් ඖෂධ වර්ග විශාල ප්‍රමාණයක් ආනයනය කිරීමද තහනම් කර ඇත. මේ තත්ත්වය ඖෂධ නිෂ්පාදනයට බලපෑමක් වනු ඇත. දේශීය ඖෂධ වගාවන් නංවාලීම සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් ව්‍යාපාති රැසක් ආරම්භ කර ඇතත් ඒවායේ ප්‍රතිඵල ලැබෙනුයේ දිගු කාලීන වශයෙනි. එබැවින් වාණිජ මට්ටමේ ඖෂධ වගා කිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග ඉතාමත් සුළුය. එම නිසා සංස්ථාවට අවශ්‍ය දේශීය වශයෙන් වැඩෙන ඖෂධ වගා කිරීම සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් ඔසුගොවි ව්‍යාපෘති 06ක් තාවකාලික භාරදී ඇති අතර එම ව්‍යාපෘති 06 නැවත එම අමාත්‍යාංශයට පසුව භාරදුණි. නිකවැරටිය රන්දෙනිගම අක්කර 52ක ඉඩමේ වගාවන් දැනට සංස්ථාව වසර කිහිපයකට පෙර ආරම්භ කර ඇත. එම ඉඩමෙන් ලැබෙන ඖෂධ වගාවන් අතර කටුවැල්බටු, අමුකහ, ඉඟුරු, බිං කොහොඹ, රත් හඳුන්, සුදු හඳුන්, කෝමාරිකා, නෙල්ලි, නික ආදී වගාවන් මේ වන විට ආරම්භ කර ඇති අතර මෙම වගාවන් තුළින් 2011 වර්ෂයේදී ඖෂධ වර්ග 28ක පිරිවැය වන රුපියල් 216,619.00කින් යුතු ඖෂධ අමු ද්‍රව්‍යද 2012 වර්ෂයේදී ඖෂධ වර්ග 48කින් යුත් පිරිවැය වන රුපියල් 624,828.40ක ඖෂධ ද 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් ඖෂධ වර්ග 41ක් හ ඖෂධ වර්ග 31කින් රුපියල් 787,720.60ක් සහ රුපියල් 728,341.50ක අමු ද්‍රව්‍ය වශයෙන් එම ඔසු උයනෙන් ලැබී ඇත. එහෙත් මෙම ඔසු උයන තුළ යටිතල පහසුකම් දියුණු කර අදාළ ඖෂධ වගාවන් දියුණු කිරීමට මේ වන විට කටයුතු කර ඇත.

# 11. හෝමියෝපති රෝහල/ හෝමියෝපති වෛද්‍ය සභාව

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය රෝගයට පමණක් නොව රෝග මූලයටද ප්‍රතිකාර කරනු ලබන සුවිශේෂී වෛද්‍ය ක්‍රමයකි. ජර්මන් ජාතික සැමුවෙල් හානිමාන් නැමැති වෛද්‍යවරයා විසින් අරඹන ලද හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පවත්වාගෙන යාම හා ප්‍රචලිත කිරීමේ ප්‍රධාන ආයතනය වන්නේ 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ ස්ථාපිත කරන ලද වැලිසර අංක 94 දරණ ස්ථානයේ පිහිටි හෝමියෝපති වෛද්‍ය සභාව වන අතර ඒ සම්බන්ධව ශ්‍රී ලංකාවේ ඇති ප්‍රථම හා එකම හෝමියෝපති රෝහල වැලිසර පිහිටි රජයේ හෝමියෝපති රෝහලයි. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් වැලිසර රජයේ හෝමියෝපති රෝහල හා හෝමියෝපති වෛද්‍ය සභාව පාලනය වේ.

### හෝමියෝපති රෝහල

<u>**රජයේ හෝමියෝපති රෝහල, වැලිසර - 2014**</u>

රජයේ හෝමියෝපති රෝහල සෞඛ්‍ය පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය විසින් 2003 වසරේ ආරම්භ කරන ලදී. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් පාලනය වන මෙම රෝහලට, 2014 වසර සඳහා මිලියන 45 ප්‍රාග්ධන ප්‍රතිපාදන හා මිලියන 18ක් පුනරාවර්තන ප්‍රතිපාදන ලබාදෙන ලදී. රජයට අයත් එකම හෝමියෝපති රෝහල වන මෙහි අභ්‍යන්තර හා බාහිර රෝගී සත්කාරක සේවාවන් නොමිලේ සැපයේ. බාහිර රෝගී අංශය මඟින් දිනකට රෝගීන් 150ට පමණ ප්‍රතිකාර සැපයෙන අතර, අභ්‍යන්තර රෝගී අංශයෙහි දිනකට රෝගීන් 20කට නේවාසික ප්‍රතිකාර ලබාගත හැකි වේ.

<u>**දැක්ම**</u>

ශ්‍රී ලාංකිය සමස්ත ජනතාවගේ සංවර්ධනයට දායක විය හැකි සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම.

<u>**මෙහෙවර**</u>

ශ්‍රී ලාංකාවේ සියළුම ජනතාවට අඩුම වියදමකින් යුතුව රෝග සමනය හා රෝග වලක්වා ගැනීමට පහසු හා ලාභදායික වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා වැලිසර හෝමියෝපති රෝහල මගින් ක්‍රියාකාරී වැඩසටහනක් ජනතාව අතරට ගෙනයාම

## 2014 වසරේ ප්‍රගතිය

- බෝනොවන රෝග හා රෝග මුල් අවස්ථාවේ හඳුනාගැනීමට පහසුවන පරිදි රසායනාගාර සේවය ස්ථාපිත කිරීම
- 2014 වසරට හෝමියෝපති රෝහලට මිලියන 0.8ක් පමණ ඖෂධ ආනයනය කර ඇති අතර, වෛද්‍ය සභාව යටතේ පාලනය වන නිදහස් හෝමියෝපති සායන සඳහා හෝමියෝපති ඖෂධ රෝහල මඟින් සැපයීම සිදුකරයි.
- ඉන්දියානු රජය මඟින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට, කල්කටා හෝමියෝපති ජාතික ආයතනයේ හෝමියෝපති උපාධි පාඨමාලා (වසර 5) හැදෑරීමට සිසුන් යොමු කිරීම සඳහා වාර්ෂිකව ශිෂ්‍යත්ව ලබාදෙන අතර, 2014 වසරේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් හත්දෙනෙකු යොමු කරන ලදී.
- විදේශීය හෝමියෝපති වෛද්‍ය පාඨමාලා හැදෑරූ වෛද්‍යවරුන් සඳහා හෝමියෝපති රෝහලේ සායනික ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලසන අතර, 2008 වසරේදී ශිෂ්‍යත්ව වැඩපිළිවෙල යටතේ යොමුවූ ශිෂ්‍යාවන් දෙදෙනෙක් 2014 වසරේදී රෝහලේ සායනික ක්‍රියාකාරකම් සඳහා සහභාගී විය.

හෝමියෝපති වෛද්‍ය සභාව විසින්, සංවිධානය කරන ලද ජංගම සායන නවයක් සඳහා හෝමියෝපති රෝහල මඟින් ප්‍රතිකාරක සේවා ලබාදුන් අතර, සංඛ්‍යාලේඛන පහත පරිදි වේ.

| සායන පැවැත්වූ ස්ථානය | ප්‍රතිකාර ලද රෝගින් සංඛ්‍යාව |
|---|---|
| **පොතුපිටිය, වාද්දුව** | 150 |
| **පෙරියමුල්ල, මීගමුව** | 191 |
| **තිස්සමහාරාමය, දෙබරවැව** | 550 |
| **නිකවැරටිය** | 51 |
| **පාදෙනිය,වාරියපොල** | 88 |
| **බිංගිරිය** | 79 |
| **කලපුව ගම්මානය, කටුකුරුන්ද** | 68 |
| **ගලේවෙල** | 45 |
| **ඉබ්බාගමුව, කුරුණෑගල** | 79 |

**2014 වසරේදී බාහිර හා අභ්‍යන්තර ප්‍රතිකාර සේවා ලබාදුන් රෝගීන්ගේ සංඛ්‍යාලේඛන**

| මාසය | 2014 | |
|---|---|---|
| | බාහිර රෝගී අංශය | අභ්‍යන්තර රෝගී අංශය |
| ජනවාරි | 2080 | 14 |
| පෙබරවාරි | 1953 | 11 |
| මාර්තු | 2420 | 34 |
| අප්‍රේල් | 2122 | 19 |
| මැයි | 1878 | 19 |
| ජූනි | 1757 | 11 |
| ජූලි | 1658 | 13 |
| අගෝස්තු | 1884 | 18 |
| සැප්තැම්බර් | 1781 | 15 |
| ඔක්තෝබර් | 1706 | 15 |
| නොවැම්බර් | 1540 | 9 |
| දෙසැම්බර් | 1682 | 9 |
| එකතුව | **22461** | **187** |





**හෝමියෝපති රෝහලේ නිලධාරින් සඳහා මිලියන 79 වටිනාකමකින් යුත් නිල නිවස සංකීර්ණයේ පළමු අදියරේ (මිලියන 52.7 ) ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම.**

## හෝමියෝපති වෛද්‍ය සභාව :

1970 අංක 07 දරණ හෝමියෝපති පනතේ පළමුවන කොටසේ 2 (1) වගන්තියේ (1) වන උපවගන්ති ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කර ඇත. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය නියාමනය, වෛද්‍යවරු ලියාපදිංචිය සහ වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම මෙමගින් සිදු කරයි.මේ වන විට අතුරු පාලක කමිටුවක් මගින් සියළු කටයුතු පාලනය වේ. හෝමියෝපති වෛද්‍ය සභාව යටතේ රජයේ නිදහස් හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථාන 07ක් ක්‍රියාත්මක වේ. ඒවා කුරුණෑගල, මොණරාගල, පරකඩුව, මාතලේ, තෝලංගමුව, දෙහිවල හා පාලමුනෙයි යන ස්ථානවල පිහිටා ඇත.


**දැක්ම**

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම.

**මෙහෙවර**

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම.

**හෝමියෝපති වෛද්‍ය සභාවේ ව්‍යුහය**



**1. සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය**

1. හෝමියෝපති වෛද්‍ය සභාව විසින් පවත්වාගෙන යනු ලබන රජයේ හෝමියෝපති සායන සඳහා 2014 වසර තුළ රෝගීන්ගේ පැමිණීම පහත සඳහන් පරිදිය.

| | | |
|---|---|---|
| දෙහිවල | - | 7963 |
| පරකඩුව | - | 7854 |
| මාතලේ | - | 6411 |
| කුරුණෑගල - | | 8313 |
| මොණරාගල - | | 5936 |
| පාලමුනෙ - | | 8753 |
| තෝලංගමුව - | | 5299 |
| **එකතුව** | | **50529** |

**204 වසරේ ප්‍රගතිය**

- මෙම වසරේ ජනවාරි මාසයේදී හෝමියෝපති පනතේ 27(1) ඇ වගන්තිය යටතේ නව හෝමියෝපති වෛද්‍යවරුන් 47 දෙනෙකු වෙත ලියා පදිංචිය ලබා දෙන ලදී.

- හෝමියෝපති වෛද්‍ය තාවකාලික වෘත්තිකයන් ලෙස අංක 1623 දරණ ගැසට් පත්‍රයේ නම් සඳහන් වෛද්‍යවරුන් සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි කිරීම සඳහා SR/FR/187/2013 නඩු තීන්දුව පරිදි හෝමියෝපති පනතේ 27(5) වගන්තියට අනුකූලව විභාගයක් පවත්වන ලදී. අමාත්‍යාංශ ලේකම් විසින් විභාග කමිටුවක් පත් කළ අතර පුවත්පත් මඟින් කළ අයදුම්පත් කැඳවීමට අනුව විභාග අපේක්ෂකයින් 38 දෙනෙකු විභාගය සඳහා අයදුම් කරන ලදී. 37 දෙනෙකු විභාගය සඳහා පෙනී සිටින ලදී. 19 දෙනෙකු විභාගය සමත් වූ අතර ඒ අය සඳහා 2014.12.31 වන දින හෝමියෝපති පනතේ 27(5) වගන්තිය යටතේ ලියාපදිංචිය ලබා දෙන ලදී.

- 2013 වසර සඳහා ලියාපදිංචිය යාවත්කාලීන කළ සාමාන්‍ය ලේඛණයේ ලියාපදංචි වෛද්‍යවරුන්ගේ නාම ලේඛණය ගැසට් කරන ලදී. 2014 / 2015 වසර සඳහා ලියාපදිංචිය යාවත්කාලීන කළ හෝමියෝපති වෛද්‍යවරුන්ගේ නාම ලේඛණය ගැසට් පත්‍ර යේ පළ කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කෙරුණි .

- හෝමියෝපති වෛද්‍යවරුන්ගේ අවබෝධය සහ ඔවුන් අත රඅනෝන්‍යාන්‍ය සුහදතාවය වර්ධනය කිරීමේ අරමුණින් හෝමියෝපති වෛද්‍යවරුන් සඳහා එක් දින වැඩමුළුවක් 2014.04.29 දින මහරගම නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනායේදී පවත්වන ලදී. මෙහිදී ප්‍රධාන දේශනය ඉන්දියානු ජාතික හෝමියෝපති වෛද්‍ය මහාචාර්ය සිද්ධාර්ත් මෙසාජි ජොන්ඩාලේ මහතා විසින් පවත්වන ලදී.

❖ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මෙම පාසල් වැඩසටහන ගලේවෙල පලාත් අධ්‍යාපන කාර්යාලයේ මෙහෙයවීමෙන් 2014.08.26 සහ 2014.08.27 යන දිනයන්හිදී පවත්වන ලදී. 2014.08.27 දින වැඩමුළුව පළාත් අධ්‍යාපන කොට්ඨාශයේ සියළුම විදුහල්පතිවරුන් සඳහා එක් දින වැඩමුළුවක් ලෙස පැවැත්වුණි.

❖ වැලිසර හෝමියෝපති රෝහල සමඟ එක්ව ජංගම සායන 09ක් පවත්වන ලදී. වාද්දුව, මීගමුව, දෙබරවැව, නිකවැරටිය, වාරියපොල, බිංගිරිය, කටුකුරුන්ද, ගලේවෙල, කුරුණෑගල යන ස්ථානයන්හි පැවුත්වූ හෝමියෝපති ජංගම සායන සඳහා රෝගීන් 1301 දෙනෙකු සහභාගී වී ප්‍රතිකාර ලබා ගන්නා ලදී.

❖ 2014 වසර තුළ හෝමියෝපති ඖෂධ ආනයනය සඳහා වෛද්‍යවරුන් ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් 15ක් සඳහා අනුමැතිය ලබා දුනි. ඒවායෙහි මුළු වටිනාකම ඇමරිකන් ඩොලර් 36, 857.13ක් හා ඉන්දියානු රුපියල් 137,113ක් විය.